## පළමුවැනි පරිශිෂ්ටය.

(අ) 1961 දී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද මහ බැංකුවේ සහ බැංකු සංස්ථාවල කටයුතු හා ගනු දෙනුවලට අදාල ප්‍රධාන නීතිවලින් උපුටාගත් කොටස්.

(ආ) 1961 දී මුදල් මණ්ඩලය විසින් සකස් කරගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

## 1961 ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද මහ බැංකුවේ සහ බැංකු සංස්ථාවල කටයුතු හා ගනුදෙනුවලට අදාළ ප්‍රධාන නීතිවලින් උපුටාගත් කොටස

## 1961 අංක 7 දරන ජාත්‍යන්තර සංවර්ධන සංගම් පනත*

**2.** මුදල් ඇමතිවරයාට, ඔහුගේ අත්සන යටතේ වූ නීත්‍යානුකූල ලියවිල්ලකින් එම නීත්‍යානුකූල ලියවිල්ලෙහි නම් කරනු ලැබූ පුද්ගලයෙකුට ලංකාණ්ඩුව වෙනුවෙන් :–

(අ) මෙම පනතේ උප ලේඛනයේ දක්වා ඇති (මෙහින් පසු කොන්දේසි යනුවෙන් හඳුන්වනු ලබන) ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ගිවිසුමේ කොන්දේසිවලට අත්සන් කිරීමට, සහ

(ආ) වෙන්කර තැබීමක් නොමැතිව ලංකාවේ නීතිය අනුව කොන්දේසි පිළිගත් බවත්, කොන්දේසි යටතේ රජයේ බැඳුම් ඉටු කිරීම සඳහා රජය විසින් සියලුම කටයුතුකර ඇති බවත් දක්වෙන නීත්‍යානුකූල ලියවිල්ලක් ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ සංවර්ධන බැංකුවෙහි (මෙහින්පසු බැංකුව යයි හඳුන්වනු ලබන) තැන්පත් කිරීමට,

කොන්දේසිවල දෙ වැනි කොන්දේසියෙහි පළමු වැනි වගන්තියේ (අ) යටතේ ආරම්භක සමාජිකයෙකු වීමට හිමිකමක් තිබෙන ලංකාවට එම සංගමයෙහි සාමාජිකත්වය පිළිගැනීමට හැකි වන පරිදි, බලය දෙනු ලැබේ.

**3**. කොන්දේසිවල 8 වැනි කොන්දේසියෙහි 2 සිට 9 දක්වා වූ වගන්තිවල විධිවිධානවලට ලංකාව තුළ නීතියේ බලය තිබිය යුතුය. ඒ අනුව සංගමයට :–

(අ) එකී 8 වැනි කොන්දේසියෙහි 2 වැනි වගන්තියේ නියමිත තත්ත්වය සහ හැකියාව ලංකාවේ තිබිය යුතුය.

(ආ) එකී 8 වැනි වගන්තියෙහි සිට 9 දක්වා වගන්තීන්හි නියමිත විශේෂ මුක්ති සහ වරප්‍රසාද ලංකාව තුළ තිබිය යුතුය.

**4**. කොන්දේසිවල 4 වැනි කොන්දේසියෙහි දෙ වැනි වගන්තිය සහ කොන්දේසියෙහි 2 වැනි වගන්තියෙහි (ඇ) උප වගන්තිය යටතේ ලංකාවේ දී හෝ ලංකාව විසින් ගෙවිය යුතු දායක මුදලෙන් සංගමය විසින් කොන්දේසිවල 2 වැනි කොන්දේසියෙහි 2 වැනි වගන්තියෙහි (ඉ) උප වගන්තිය යටතේ සංගමයට පිළිගැනීමට තීරණය කළ හැකි කුමන කොටසක් හෝ වෙනුවට, මුදල් ඇමතිවරයාට ඔහු සුදුසු යැයි සිතන්නේ නම් ඔහු විසින් සුදුසු යයි සිතන ආකාරයකට සංගමයේ ගිණුමට ඉල්ලූ විට සමාන වටිනාකමට ලබා ගත හැකි, පොළී නොදරන ගනුදෙනු නොකළ හැකි නෝට්ටු හෝ සමාන බැඳුම්කර, ලංකාණ්ඩුව වෙනුවෙන් සංගමය සඳහා ඇති කොට, නිකුත් කළ හැකිය.

### ඒකාබද්ධ අරමුදලෙන් කරන ගෙවීම්

**5.** ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන්:–

(අ) කොන්දේසිවල 2 වැනි කොන්දේසියෙහි 2 වැනි වගන්තිය යටතේ ලංකාවේ ආරම්භක දායක මුදල වශයෙන් සංගමයට ගෙවීමට අවශ්‍ය වන යම් මුදල්;

(ආ) කොන්දේසි යටතේ ලංකාව විසින් කලින් කල සංගමයට ගෙවිය යුතු වන යම් මුදල්; සහ

(ඇ) මෙම පනත යටතේ සංගමයට නිකුත් කළ හෝ ඇති කරන ලද යම් නෝට්ටු හෝ බැඳුම්කර බේරීම සඳහා අවශ්‍ය යම් මුදල් ගෙවිය යුතුය.

---

* පනතේ 1 වැනි වගන්තියේ, පනතේ නාමය දක්වෙයි.

**6. මහ බැංකුවට රජයේ භෝචිචු හෝ බැඳුම්කර නිකුත් කිරීම**

1. 5 වැනි වගන්තිය යටතේ ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීමට අවශ්‍ය යම් මුදල් සඳහා ඉඩ සැලසීමට, මුදල් ඇමතිවරයා විසින් සුදුසු යයි සිතන ආකාරයකට ලංකාණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පොලී නොදරන ගනුදෙනු නො කළ හැකි භෝචිචු හෝ බැඳුම්කර ඇති කිරීමෙන් හා නිකුත් කිරීමෙන් ණය ලබා ගැනීමට මුදල් ඇමතිවරයාට මෙයින් බලය දෙනු ලැබේ.

2. 1949 අංක 58 දරන මුදල් නීති පනතේ කෙසේ තිබුන ද, මෙම වගන්තියේ පළමු වැනි උප වගන්තියේ විධිවිධාන අනුව ඇති කරන ලද හෝ නිකුත් කරන ලද භෝචිචු හෝ බැඳුම්කර දැරීමට හා පිළිගැනීමට මහ බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

3. මෙම වගන්තියේ පළමු වැනි උප වගන්තිය යටතේ මහ බැංකුව වෙත නිකුත් කරන ලද හෝ ඇති කරන ලද භෝචිචු හෝ බැඳුම්කර බේරීම සඳහා අවශ්‍ය සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතුය.

7 කොන්දේසි යටතේ සංගමයෙන් ලංකාණ්ඩුව වෙත හෝ වෙනුවෙන් ලැබෙන සියලුම මුදල්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. වෙන ලිඛිත නීතියක වෙනත් ලෙසක ඉඩ සලසා නොමැති නම් මහ බැංකුවට, මෙම පනත යටතේ නිකුත් කරන ලද භෝචිචු හෝ වෙනත් බැඳුම්කර බේරීම සඳහා එසේ ලැබෙන මුදල්වල ප්‍රාග් ධන කොටස් කලින් කල යෙදීමට විධාන කිරීමට, මුදල් ඇමතිවරයාට හැකිය.

8. කොන්දේසිවල යම් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සාධාරණ ලෙස ඔහු විසින් අවශ්‍ය යයි සලකන යම් අනෙකුත් විධිවිධාන සකස් කිරීමට ගැසට් පත්‍රයේ පළ කරන ආඥවකින් මුදල් ඇමතිවරයාට හැකිය. මෙම වගන්තිය යටතේ සකස් කොට පළ කරන සෑම ආඥවක්ම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එය දින 14 ක් ඇතුළත අනුමත නොකළේ නම් හැර, එයට නීතියේ බලය තිබිය යුතුය.

## 1961 අංක 29 දරන මහජන බැංකු පනත

2. (1) මහජන බැංකුව නමින් හැඳින්වෙන (මෙයින් පසු මෙම පනතේ බැංකුව නමින් සඳහන් කෙරෙන) බැංකුවක් පිහිටුවිය යුතුය. එය එවකට බැංකුවේ කොටස් හිමියන් වන පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතුය.

(2) බැංකුව, එයට 1 වැනි උප වගන්තියෙන් පවරා ඇති නමින්, බලය ලත් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. එම සංස්ථාවට එනමින්, නීති කෘත්‍යයක යෙදීමට හෝ එම සංස්ථාවට විරුද්ධව නීති කෘත්‍යයක හෝ යෙදීමට හැකිය.

3. (1) බැංකුවේ මුද්‍රාවට අධිකරණ සැලකිල්ල ලැබිය යුතු අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය භාරයේ තිබිය යුතුය.

(2) බැංකුව විසින් තීරණය කරන පරිදි මුද්‍රාව වෙනස් කළ හැකිය.

4. සමුපකාර සමිතිවලට, අනුමතකළ සමිතිවලට, ගොවිකාරක සභාවලට, හා අනෙකුත් අයට මුදලින් හා වෙනත් ආධාර සැපයීමෙන් ලංකාවේ සමුපකාර ව්‍යාපාරයත්, ගම්බද බැංකු ක්‍රමයත්, කෘෂිකාර්මික ණය ක්‍රමයත් දියුණු කිරීම බැංකුවේ පරමාර්ථය විය යුතුය.

5. (1) එහි පරමාර්ථයක් ඉටු කිරීම සඳහා බැංකුවට පහත දැක්වෙන බලතල සියල්ලම හෝ එයින් කුමන බලතලයක් හෝ දැරිය හැකිය.

(අ) 2 වැනි උප වගන්තියේ විධිවිධානයන්ට යටත්ව,

(i) සමුපකාර සමිතිවලට, අනුමත කළ සමිතිවලට හා ගොවිකාරක සභාවලට කෙටි කාලීන, මැදි කාලීන හා දිගු කාලීන ණය හා පිළිසරණ ණය දීම,

(ii) ගොඩනැගිලි තැනීමට, අළුත්වැඩියා කිරීමට හා ප්‍රතිසංස්කරණය කිරීමට සමුපකාර සමිතිවලට, අනුමත කළ සමිතිවලට, ගොවිකාරක සභාවලට හා පුද්ගලයන්ට කෙටි කාලීන, මැදි කාලීන, දිගු කාලීන ණය දීම.

(iii) සුළු පරිමාණ ව්‍යාපාරයක් යයි බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන, ව්‍යාපාරයක් කාර්මික ව්‍යාපාරයක් හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට අදහස් කරන, කුමනපුද්ගලයෙකුට හෝ කෙටි කාලීන, මැදි කාලීන, හෝ දිගු කාලීන ණය හෝ අනෙකුත් පිළිසරණ ණය දීම.

(iv) පෞද්ගලික ගේ දෙර අවශ්‍යතා සඳහා වුවමනා කරන භාණ්ඩ මිල දී ගැනීම සඳහා ගම්බද ප්‍රදේශවල පදිංචි පුද්ගලයන්ට කෙටි කාලීන ණය දීම.

(ආ) නියම කෙරෙන වෙනස්කිරීම්වලට හා ව්‍යතිරේකයන්ට යටත්ව 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත යටතේ ලංකා බැංකුව පවත්වාගෙන යන ලද, කරන ලද ගනුදෙනුවලට සමාන වර්ගයේ ගනුදෙනු පවත්වාගෙන යාම හා කිරීම.

(ඇ) නියම කෙරෙන කොන්දේසිවලට යටත්ව බදු උකස් ගන්නෙකුගේ කාර්යයන්හි යෙදීම.

(ඈ) බැංකුව විසින් ණය හෝ අයිරාවන් දෙනු ලබන කුමන පුද්ගලයෙකුට හෝ කාර්මික ආධාර සැපයීම සහ ඉඩම්වල වටිනාකම හා ණය ගන්නන්ගේ ණය ගෙවීමේ හැකියාව තක්සේරු කිරීම හා රන්වල පිරිසිදු බව සෙවීම, බැංකු කටයුතු, මුදල් පරිහරණය යන විෂයයන්හි පුද්ගලයන් පුහුණු කිරීමට ඉදිරිපත් කිරීම හා භාර ගැනීම..

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩලය සුදුසු යයි සිතන පරිදි බැංකුවෙහි අකර්මන්‍ය අරමුදල්, සුරැකුම්පත්වල ආයෝජනය කිරීම.

(උ) බැංකුවේ කාර්යයන් කර ගෙන යාමට අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් සේවයෙහි යෙදවීම.

(ඌ) බැංකුවේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ විනය පාලනය සඳහා හා සේවා කොන්දේසි පිළිබඳ ව්‍යවස්ථා සකස් කිරීම.

(එ) එවැනි නිලධාරීන්ගේ හා සේවකයන්ගේ සුභ සාධනය සඳහා ක්‍රම හා ඔවුන් සඳහා අර්ථ සාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් පිහිටුවීම.

(ඒ) බැංකුවේ ගනුදෙනු සඳහා මුදල් ණයට ගැනීම සහ ලබා ගන්නා ණය හෝ අයිරාවන් සඳහා ඇප තැබීම.

(ඔ) ගිවිසුම්වලට ඇතුළත් වීම.

(ඕ) ඉහත කී බලතල දැරීමට අදාළ හෝ සම්බන්ධිත, අනෙකුත් සෑම දෙයක්ම කිරීම.

(2) ණය, අයිරාවන් හෝ පිළිසරණ ණය දීමට බැංකුවට ඇති බලය, සමුපකාර සමිති පිළිබඳව හැරෙන්නට, අනුමත කළ සමිති හෝ ගොවිකාරක සභා හෝ අනෙකුත් පුද්ගලයින් සම්බන්ධයෙන් හෝ ඇමතිවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් එම බලය දැරීම අනුමත කරන තුරු නො දැරිය යුතුය.

(3) බැංකුව උකස් ගන්නෙකුගේ කාර්යයන්හි යෙදෙන විට 1942 අංක 13 දරන උකස් ගන්නන්ගේ ආඥා පනත බල නොපැවැත්විය යුතුය

6 බැංකුවේ ප්‍රධාන ගනුදෙනු මූලස්ථානය කොළඹ විය යුතු අතර, එහි ගනුදෙනු නිසියාකාර කරගෙන යාමට අවශ්‍ය පරිදි ශාඛා නියෝජ්‍යායතන් පිහිටුවිය හැකිය.

7. (1) බැංකුවේ කටයුතු හා ගනුදෙනුවල පාලනය හා පරිපාලනය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය (මෙයින් පසු මෙම පනතේ මණ්ඩලය යනුවෙන් සඳහන් කරන) කෙරෙහි පැවරිය යුතුය.

(2) මණ්ඩලයට, බැංකුවේ බලතල සියල්ලම හෝ කුමන බලතලයක් හෝ දූරිය හැකිය.

8. (1) මණ්ඩලය පහත දැක්වෙන අධ්‍යක්ෂ වරුන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) නිල අධ්‍යක්ෂ විය යුතු සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා

(ආ) ඇමතිවරයා විසින් පත් කරන අධ්‍යක්ෂවරු දෙදෙනෙක්

(ඇ) ඇමතිවරයා විසින් දැනට ග්‍රාමසංවර්ධනය භාරව සිටීම සඳහා පත් කරන අධ්‍යක්ෂවරයෙක්.

(ඈ) මුදල් ඇමතිවරයා විසින් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙක්.

(ඉ) 2 වැනි උප වගන්තිය ප්‍රකාර පත් කරන හෝ ඡන්දයෙන් තෝරා පත් කරන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්.

(2) ප්‍රථම වරට නිල දැරීම සඳහා 1 (ඉ) වන උප වගන්තියේ සඳහන් අධ්‍යක්ෂ වරු තිදෙනා ඇමතිවරයා විසින් පත් කළ යුතුය. යම්කිසි හේතුවක් නිසාවෙන් එසේ පත් කළ යම් අධ්‍යක්ෂවරයෙක් නිලයෙන් අස්වුවහොත් එම තනතුරෙහි ඉතිරි කාලය සඳහා කෙනෙකු ඇමතිවරයා විසින් පත් කළ යුතුය. ඉන් පසු එවැනි අධ්‍යක්ෂවරුන් පත් කළ යුත්තේ, බැංකුවේ සාමාන්‍ය මණ්ඩලය විසින් ඒ සඳහා නියම කෙරෙන පිළිවෙතක් අනුව එවැනි සුදුසුකම් දරන්නවුන්ගෙනි.

(3) 4 වැනි වගන්තියේ විධිවිධානයන්ට යටත්ව නිල අධ්‍යක්ෂවරයාගේ හෝ 1 වැනි උප වගන්තියේ 'ඉ' ඡේදය අනුව පත් කැරෙන අධ්‍යක්ෂවරයෙකු හෝ සම්බන්ධයෙන් හැර අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය වර්ෂ තුනක් විය යුතුය. 1 වැනි උප වගන්තියේ 'ඉ' ඡේදය අනුව පත් කැරෙන අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය වර්ෂ දෙකක් විය යුතුය.

(4) නිල අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් යම් අධ්‍යක්ෂවරයෙකු ඔහුගේ සේවා කාලය අවසන් වීමට පෙර ඔහුගේ ධූරය අත්හැරියහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් එවැනි අනුප්‍රාප්තිකයා කලින් ධූරය අත්හැරිය-හොත් හැර, එවැනි නොනිමි සේවා කාලය සඳහා නිල දැරිය යුතුයි.

(5) කාලය ඇවෑමෙන් අධ්‍යක්ෂධූරය අත්හරින අධ්‍යක්ෂවරයෙකු නැවත පත් කිරීම හෝ නැවත ඡන්දයෙන් තෝරා ගැනීම සඳහා සුදුසු විය යුතුය.

(6) පහත දැක්වෙන අයෙකු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කිරීමට හෝ ඡන්දයෙන් තෝරා ගැනීමට හෝ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කිරීමට සුදුසු නොවිය යුතුය.

(අ) උත්තර මන්ත්‍රීවරයෙකු හෝ පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකු

(ආ) ලංකාවේ දැනට වලංගු කුමන නීතියක් යටතේ හෝ විකල සිහියක් ඇත්තෙකැයි ප්‍රකාශ කරනු ලැබූ අයෙකු.

(ඇ) ලංකාවේ දැනට වලංගු හෝ වෙනත් රටක කුමන නීතියක් යටතේ හෝ බංකොලොත් ලැබූවකු හෝ වස්තු භංගත්වයට පත්වූ අයෙකු ලෙස ප්‍රකාශ කරනු ලැබූ, නිදහස නොලත් බංකොලොත්කරුවෙකු, හෝ වස්තු භංගත්වය ලැබූ අයෙකු.

(ඈ) මාස හයකට නො අඩු කාලයක් සඳහා සිර දඬුවමක් දිය හැකි දුරාචාරයක් පිළිබඳ වරදක් සම්බන්ධයෙන් වරදකරුවෙකු කරනු ලැබූ අයෙකු.

(ඉ) බැංකුව හැර වෙනත් වෙළෙඳ බැංකුවක සේවකයෙකු හෝ අධ්‍යක්ෂ-වරයෙකු හෝ

(7) ඇමතිවරයා විසින් පත් කරන අධ්‍යක්ෂවරයෙකු, ඇමතිවරයා විසින් අත්සන් කරන ලියවිල්ලකින් සේවයෙන් ඉවත් කළ හැකිය.

(8) 1 වැනි උප වගන්තියේ (ඉ) ඡේදය යටතේ ඡන්දයෙන් තෝරා ගනු ලැබූ අධ්‍යක්ෂවරයෙකු, බැංකුවේ සාමාන්‍ය මණ්ඩලයේ රැස්වීමකදී, එම රැස්වීමට පැමිණ සිටින, එම යෝජනාව සඳහා ඡන්දය දිය හැකි සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් සම්මත වන විශ්වාස භංග යෝජනාවකින්, ධුරයෙන් ඉවත් විය යුතුය. ඔහුගේ අනුප්‍රාප්තිකයා, එවැනි අධ්‍යක්ෂවරයාගේ නොනිමි සේවා කාලය සඳහා ඡන්දයෙන් තෝරා ගත යුතුය.

(9) නිල අධ්‍යක්ෂ නොවන අධ්‍යක්ෂවරයෙකුට, ඇමතිවරයා වෙත ලියන ලිපියකින් මණ්ඩලයෙන් අස්විය හැකිය.

(10) නිල අධ්‍යක්ෂ හැර අනෙකුත් සියලු අධ්‍යක්ෂවරුන්ට හෝ කුමන අධ්‍යක්ෂ-වරයෙකුට හෝ, මුදල් ඇමතිවරයාගේ ද සම්මුතිය ඇතිව ඇමතිවරයා විසින් තීරණය කරන පාරිශ්‍රමිකයක් ගෙවිය හැකිය.

(11) මණ්ඩලයේ කුමන රැස්වීමකට හෝ ගණපූරණය පහක් විය යුතුය.

(12) මෙම පනත යටතේ සකස් කළ හැකි කුමන නියෝගයකට හෝ 11වැනි උප වගන්තියේ විධිවිධානයන්ට හෝ යටත්ව, මණ්ඩලයට එයි වැඩ පිළිවෙළ විධිමත් කළ හැකිය.

(13) අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාවෙන් හෝ අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමේ හෝ ඡන්ද බලයෙන් තෝරා ගැනීමේ හෝ දෝෂයක් තිබීමේ හේතුව නිසාවෙන් පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ නීති කෘත්‍යයක් අවලංගු නොවිය යුතුය.

9 (1) භාණ්ඩාගාරයේ ලේකම්වරයා, මණ්ඩලයේ සාමාජිකයන් හා බැංකුවේ කොටස්කරුවන් වන සමුපකාර සමිති විසින් සාමාන්‍ය මණ්ඩලයේ ඒවා නියෝජනය කිරීමට පත් කරන නියෝජිතයන් යන අයගෙන් සාමාන්‍ය මණ්ඩලය සමන්විත විය යුතුය.

(2) බැංකුවේ කොටස්කරුවන් වන සමුපකාර සමිතිවලට සාමාන්‍ය මණ්ඩලයේ තම සමිති නියෝජනය කිරීම සඳහා පත් කළහැකි නියෝජිත සංඛ්‍යාව, එවැනි පුද්ගලයන්ට තිබිය යුතු සුදුසුකම් සහ එවැනි පුද්ගලයන් තෝරා ගැනීමේ අනුගමනය කළයුතු පිළිවෙත පිළිබඳ නියෝග සකස් කළ හැකිය.

(3) තම සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාවෙන් පමණක් පනත මගින් එය වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීමට, බැංකුවේ සාමාන්‍ය මණ්ඩලය නුසුදුසු නොවිය යුතුය.

(4) බැංකුවේ සාමාන්‍ය මණ්ඩලය හමුවට තබන, අධ්‍යක්ෂවරයකු තනතුරින් පහ කිරීමට හෝ ඡන්ද බලයෙන් පත්කර ගැනීමට අදාළ යෝජනාව-කට ඡන්දය දීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට, නිල අධ්‍යක්ෂට හා පත්කළ අධ්‍යක්ෂවරුන්ට හිමිකමක් නොතිබිය යුතුය.

මෙම උප වගන්තියෙහි "පත් කළ අධ්‍යක්ෂ" යනුවෙන් අදහස් කරනුයේ 8 වැනි වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පත් කරන අධ්‍යක්ෂ වරයෙකි.

10 (1) ඇමතිවරයා විසින් මණ්ඩලයේ පළමු සභාපති වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කෙනෙකු පත් කළ යුතුය. ඉන්පසුව, මණ්ඩලයේ සභාපතිවරයා තෝරාගත යුත්තේ අධ්‍යක්ෂවරුන් විසිනි. මණ්ඩලයේ සභාපති තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේ මූලසුන නිල අධ්‍යක්ෂ විසින් ඉසිලිය යුතුය. ඔහුට මේ සඳහා තීරණ ඡන්දයක් තිබිය යුතුය.

(2) ලංකා රජය පිළිබඳව, රජයේ සේවකයකු ලෙස පඩි ලබන කිසිවෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වීමට සුදුසු නොවිය යුතුය.

(3) මණ්ඩලයේ සභාපතිවරයා, කලින් සභාපති ධුරය අත් නොහැරියේ නම් ඔහු අධ්‍යක්ෂවරයකු වශයෙන් සිටිනතාක් එම තනතුර ඉසිලිය යුතුය.

11 මණ්ඩලය විසින් සලකා බැලෙන යම් ණයක් හෝ පිළිසරණයක් පිළිබඳව අවක්‍රව හෝ වක්‍රව යම් අධ්‍යක්ෂවරයෙකු උනන්දුවක් දක්වන්නේ නම්, ඔහුගේ උනන්දුවෙහි ස්වභාවය මණ්ඩලයට හෙළි කළ යුතුය. එවැනි ණයක් හෝ පිළිසරණ ණයක් මණ්ඩලය විසින් සලකා බලන අවස්ථාවේදී ඔහු නොසිටිය යුතුය.

12 (1) බැංකුවේ කොටස් ප්‍රාග් ධනය, රුපියල් පනහේ කොටස් එක්ලක්ෂ විසිදහකට බෙදුන රුපියල් හැටලක්ෂයක් විය යුතුය. එසේ වුවද, කලින් කල නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කැරෙන යෝජනාවකින් තීරණය වන පරිදි කොටස් ප්‍රාග් ධනය වැඩි කළ හැකිය.

(2) මණ්ඩලය විසින් භාණ්ඩාගාරයේ ලේකම්වරයාට, නිල වශයෙන්, රුපියල් හැටදහසක ගෙවා නිමි ප්‍රාග් ධන වෙන් කළ යුතුය. ඔහු විසින් එම කොටස් රජය සඳහා හා වෙනුවෙන් හැරිය යුතුය.

(3) මණ්ඩලය විසින් ඉතිරි කොටස් සමූපකාර සමිතිවලට දායක වීම සඳහා ඉදිරිපත් කර විය යුතුය.

(4) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, ඔහුට නිල වශයෙන් වෙන් කරන ලද කොටස් සඳහා ගෙවිය යුත්තේ, රුපියල් තිස් ලක්ෂය අතරින් 1947 අංක 39 දරන සීමාසහිත ලංකා සමූපකාර ඒකාබද්ධ බැංකුවෙන් රජයට ලැබිය යුතු මුදලත් අතර ඇති වෙනසය. එම මුදල ලංකාවේ ඒකාබඩ අරමුදලින් ගෙවිය යුතුය.

13 (1) බැංකුවේ කිසිම කොටස් දරන්නෙකු තම කොටස් සමූපකාර සමිතිවලට හෝ නිල වශයෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හැර වෙනත් අයෙකුට නොවිකිණිය යුතුය.

(2) භාණ්ඩාගාරයේ ලේකම්වරයාට මුදල් ඇමතිවරයා විසින් ඒ සඳහා බලය දුන්විට, ඔහු විසින් දරන කොටස් රජය වෙනුවෙන් හෝ සඳහා ඒවායේ සම මිලට නො අඩුව සමූපකාර සමිතිවලට විකිණිය හැකිය. විකිණීමෙන් ලබන මුදල ලංකාවේ ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

(3) භාණ්ඩාගාරයේ ලේකම්වරයාට, මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව, 1 වැනි උප වගන්තිය යටතේ මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කරන කොටස් මිල දී ගත හැකිය මිල දී ගැනීමේ දී ගෙවන මිල ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය. භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් මිල දී ගන්නා සියලුම කොටස් රජය සඳහා හා වෙනුවෙන් ඔහු විසින් දැරිය යුතුය.

14 කොටස් දරන්නෙකුගේ වගකීම ඔහුට වෙන් කරන ලද කොටස් වෙනුවෙන් බැංකුවට ලැබිය යුතු මුදලට සීමා විය යුතුය.

15 (1) රජය විසින්,

(අ) ලංකාවේ ඒකාබද්ධ අරමුදලින්,

(i) රුපියල් පන් ලක්ෂයක්; මෙයින් ගොඩනැගිලි තැනීම සඳහා අදාළ වියදම් හැර, බැංකුව පිහිටුවීම පිළිබඳව මූලික වියදම් දැරිය යුතු අතර, එවැනි මූලික වියදම් සඳහා ගැනීමෙන් ඉතිරිවන ශෙෂයක් වෙතොත් එය 22 වැනි වගන්තියේ 4 වැනි උප වගන්තියෙන් ඉඩ සලසා ඇති පරිදි සුදුස්සක් කළ යුතුය.

(ii) රුපියල් දෙලක්ෂයක්; මෙය 22 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තියේ හා 2 වැනි උප වගන්තියේ ඉඩ සලසා ඇති පරිදි සුදුස්සක් කළ යුතුය.

(iii) මෙම පනතේ විධිවිධානයන් යටතේ විසුරුවා හරින තුමන සමූපකාර සමිතියක හෝ වත්කම්වලට වැඩි වන බොල් හා අවිනිශ්චිත ණය බේරීම සඳහා, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සම්මත කැරෙන යෝජනාවකින් ඒකාබද්ධ අරමුදලින් ගෙවීමට බලය දෙන යම් මුදල්, ගෙවිය යුතුය.

(ආ) බැංකුවට දිගුකාලීන හෝ කෙටි කාලීන ණය දීම සඳහා, ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන්, බැංකුවට ණයට දිය යුතුයයි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සම්මත කැරෙන යෝජනාවකින් බලය දිය හැකි මුදල් බැංකුවට ණයට දිය යුතුය.

(2) 1 වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් බැංකුවට ණයට දෙන ලද සෑම මුදලක්ම මුදල් ඇමති වරයාගේ සම්මුතිය ඇතිව, ඇමතිවරයා විසින් තීරණය කැරෙන නියමයන් හා කොන්දේසි අනුව බැංකුව විසින් ආපසු ගෙවිය යුතුය.

16 බැංකුවට වැඩ පටන් ගැනීමට බලය දෙමින්, ඇමතිවරයා විසින් අත්සන් කොට සහතිකයක් දෙනතුරු බැංකුව ගනුදෙනු ආරම්භ නොකළ යුතුය.

17 මෙම පනත පැනවූ පසු, බැංකුවේ ගනුදෙනු අරඹනතුරු, ස්ථිර ලේකම්වරයාට,

(අ) කොටස් සඳහා අයැදුම්පත් ඉල්ලීමට හා පිළිගැනීමට

(ආ) කොටස් වෙන් කිරීමට.

(ඇ) මෙම පනතින්, මණ්ඩලයට අයිතියක් ඇති කටයුතු කිරීමට

(ඈ) බැංකුව පිහිටුවීම සඳහා අවශ්‍යය යි ඔහු විසින් සිතන, සෑම වෙනත් කටයුත්තක් කිරීමට හැකිය.

18 (1) 17 වැනි වගන්තිය යටතේ ස්ථිර ලේකම්වරයා විසින් කරන ලද සෑම ක්‍රියාවක්ම සියලුම කරුණු සඳහා මණ්ඩලය විසින් කරන ලද ක්‍රියාවක් සේ බලපැවැත්විය යුතුය.

(2) මණ්ඩලයට, ස්ථිර ලේකම්වරයා විසින් අරඹා, නොනිමි හෝ අසම්පූර්ණ සෑම කටයුත්තක්ම, එම කටයුත්ත හෝ දෙය මණ්ඩලය විසින් අරඹන ලද්දක් සේ සලකා කරගෙන යා හැකිය.

19 (1) මෙම පනතේ පරමාර්ථයන් සඳහා ගොඩනැගිලි අරමුදල නමින් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) ගොඩනැගිලි අරමුදලට භර කිරීම සඳහා රුපියල් දශ ලක්ෂයක් රජය ඒකාබද්ධ අරමුදලින් බැංකුවට දිය යුතුය.

(3) ගොඩනැගිලි අරමුදලේ මුදල්, බැංකුව සඳහා ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම සඳහාත්, ගොඩනැගිලි තැනීම, එවැනි ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම හා පවත්වාගෙන යාම සඳහාත් උපයෝගී කරගත යුතුය.

20 (1) දිගු කාලීන හෝ මැදි කාලීන ණය දීම සඳහා බැංකුවට 15 (1) (ආ) වගන්තිය යටතේ දෙනු ලබන ණය වලට අතිරේක වශයෙන්, 2 වන උප වගන්තියේ විධිවිධානයන් යටතේ හා කලින් කල මෙම පනත යටතේ සකස් කළහැකි නියෝග යටතේ ණය ලබා ගැනීමට හෝ මුදල් ඇමතිවරයාගේ ද සම්මුතිය සහිත ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව ණයකර නිකුත් කිරීමෙන්, කුමන මුදලක් හෝ ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙන් හෝ ඉල්ලීමට බැංකුවට හැකිය.

(2) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ උපදෙස් විචාරීමෙන් පසුව මුදල් ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය නොමැතිව, 1 වන වගන්තිය යටතේ කිසිම ණයකරයක් නිකුත් නොකළ යුතුය.

(3) 1. වැන වගන්තිය යටතේ ණයකර නිකුත් කිරීමට ඉල්ලූවිට, එම ඉල්ලීම ඉටු කිරීමට අදාළ ණයකර නිකුත් කිරීම මුදල් ඇමතිවරයා විසින් අනුමත කර තිබේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එම ඉල්ලීම ඉටු කළ යුතුය.

**21** (1) මුදල් ඇමතිවරයා,

(අ) 26 වැනි වගන්තියේ විධිවිධානය අනුව, එම ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව, බැංකුව දෙනලද, ණයක් අයිරාවක් හෝ වෙනත් පිළිසරණයක් හේතුකොටගෙන බැංකුවට ලැබිය යුතු යම් මුදලක් ආපසු ගෙවීම හා

(ආ) මෙම පනත යටතේ නිකුත් කරන ලද ණයකර වෙනුවෙන් ලැබිය යුතු යම් මුදලක් ආපසු ගෙවීම සම්බන්ධයෙන්, ඇපවිය යුතුය.

(2) 1 වැනි වගන්තිය යටතේ වූ ඇපය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මුදල් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය.

(3) 1 (අ) වගන්තිය යටතේ වූ ඇපයක් ඉටුකිරීම සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවන ලද කුමන මුදලක් හෝ ඇමතිවරයාගේ සම්මුතිය ඇතිව මුදල් ඇමතිවරයා විසින් තීරණය කරන ප්‍රමාණයක් අනුව වූ පොළියත් සමග එවැනි සම්මුතිය ඇතිව මුදල් ඇමතිවරයා විසින් තීරණය කරන ප්‍රකාර හා කාලසීමාව තුළ ගෙවිය යුතුය.

(4) 1 වැනි උප වගන්තිය යටතේ ඇප වූ එක්බිතිවම පසුව, මුදල් ඇමතිවරයා විසින් ඇපය පිළිබඳ ප්‍රකාශයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හමුවේ තැබිය යුතුය.

(5) 1 වැනි උප වගන්තිය යටතේ වූ ඇපවීම ඉටුකරනු වස් කුමන මුදලක් හෝ ඒකාබද්ධ අරමුදලින් ගෙවූ වහාම මුදල් ඇමතිවරයා විසින්, එම මුදල ගෙවූ බවට ප්‍රකාශයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හමුවේ තැබිය යුතුය.

**22** (1) බැංකුව විසින් සාමාන්‍ය සංචිතයක් පිහිටුවිය යුතුය.

(2) බැංකුව විසින් 15 (1) (අ) (ii) වගන්තියේ සඳහන් කර ඇති රුපියල් විසිලක්ෂයෙන් අඩක් සාමාන්‍ය සංචිතයට බැර කළ යුතුය.

(3) බොල් හා අවිනිශ්චිත ණය සඳහා බැංකුව විසින් විශේෂ සංචිතයක් පිහිටුවිය යුතුය.

(4) 15 (1) (ආ) (ii) වගන්තියේ සඳහන් කර ඇති ප්‍රාරම්භක වියදම් ගෙවා, ඉතිරිවන යම් මුදලක් වේනොත්, එම මුදල විශේෂ සංචිතයට බැර කළ යුතුය.

(5) බැංකුව විසින්, 15 (1) (අ) (ii) වගන්තියේ සඳහන් රුපියල් විසිලක්ෂයෙන් අඩක් විශේෂ සංචිතයට බැර කළ යුතුය.

**23** (1) ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන අන්දමකින් නියම කරන දිනයක සිට (මෙහින් පසු නියමිත දිනය යනුවෙන් මෙම වගන්තියේ සඳහන් කරන) ක්‍රියාත්මක වන පරිදි,

(අ) සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුව විසුරුවා හැරි ලෙස සැලකිය යුතුය.

(ආ) සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුවේ වත්කම් හා වගකීම්, බැංකුවේ වත්කම් හා වගකීම් විය යුතුය.

(2) නියමිත දින හෝ ඉන්පසු-

(අ) සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුව පාර්ශවයක් වශයෙන් එම දිනට එක්බිතිවම පෙරාදා දිනයෙහි පැවතුන හෝ ක්‍රියාත්මකව පැවති සියලුම කොන්ත්‍රාත්තු, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම් හෝ අනෙකුත් නීත්‍යානුකූල ලියවිලි, තත්වූ පරිද්දෙන්, බැංකුවට ප්‍රතිවිරුද්ධව හෝ වාසි සහගතව බලපැවැත්විය යුතුය. සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුව වෙනුවට බැංකුව ඊට පාර්ශවයක් වූවා සේ ඒවා මුළුමනින්ම හා ක්‍රියාත්මකව බලපැවැත්විය යුතුය.

(ආ) සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුව විසින් හෝ ඊට විරුද්ධව පවරා ඇති නඩු අභියාචන හෝ අනෙකුත් නීතිකෘත්‍යයන් එම දිනට එක්බිතිවම පෙරාතු දිනයේ අවසන් නොවී පැවතුනේ නම් ඒවා, අවලංගු වන්නේ හෝ අවසන් වන්නේ හෝ ඒවාට හානියක් වන පරිදි ඒවා කෙරෙහි බලපැවැත්වෙන්නේ හෝ නොවේ. ඒවා බැංකුව විසින් හෝ බැංකුවට විරුද්ධව තත් වූ පරිදි ගෙනයා හැකි හා ක්‍රියාත්මක විය හැකිය.

එසේ වුවද, මෙම උප වගන්තියේ (අ) ඡේදයේ කිසිවකින් නියමිත දිනයට එක්බිතිවම පෙරාතු දිනයෙහි සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුවෙහි සේවකයෙකුව සිටි බැංකුවේ නිලධාරියෙකුගේ හෝ සේවකයෙකුගේ සේවාව අවසන් කිරීමට හෝ සේවා තත්ත්වය වෙනස් කිරීමට හෝ බැංකුවට අයිතිය කුමන ආකාරයකින් හෝ සීමා කෙරෙන බව නොසැලකිය යුතුය.

24 (1) ඇමතිවරයා,

(අ) සමුපකාර බැංකුවක්.

i තොකඩවාම, එහි කටයුතු අසතුටුදායක ලෙස හා අකාර්යක්ෂම ලෙස කරගෙන යන බවට හෝ,

ii එය විසුරුවා එහි ගනුදෙනු බැංකුව අතට ගත යුතු යයි අදහස් කරන බවට,

සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් ලියා දන්වන තොරතුරු අනුව, හා

(ආ) බැංකුව, එවැනි සමුපකාර බැංකුවක ගනුදෙනු සියතට ගැනීමට එකඟ වන්නේ යයි,

ඇමතිවරයා තෘප්තියට පත් වන්නේ නම්, ඔහුට ගැසට් පත්‍රයේ පළ කරන ආඥාවකින් එම ආඥාවෙහි නියම කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි,

i. එම සමුපකාර බැංකුව විසුරුවා හැරි බව සැලකිය යුතු බවට හා

ii. එවැනි සමුපකාර බැංකුවක වත්කම් හා වගකීම් බැංකුවේ වත්කම් හා වගකීම් බවට ප්‍රකාශයක් කළ හැකිය.

(2) සමුපකාර බැංකුවක් සම්බන්ධයෙන් 1 වැන උප වගන්තිය යටතේ වූ ආඥාව ක්‍රියාත්මක වන දිනට හෝ ඉන් පසුව,

(අ) සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුව පාර්ශවයක් වශයෙන් එම දිනට එක්බිතිවම පෙරාතු දිනයෙහි පැවතුන හෝ ක්‍රියාත්මකව පැවැති සියලුම කොන්ත්‍රාත්තු, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, හෝ අනෙ- කුත් නීත්‍යානුකූල ලියවිලි තත් වූ පරිද්දෙන්, බැංකුවට විරුද්ධව හෝ වාසි සහගතව බලපැවැත්විය යුතුය. සීමාසහිත ලංකා සමුපකාර ඒකාබද්ධ බැංකුව වෙනුවට, බැංකුව ඊට පාර්ශවයක් වූවා සේ ඒවා මුළුමනින්ම හා ක්‍රියාත්මකව බලපැවැත්විය යුතුය.

(ආ) සීමාසහිත ලංකා ඒකාබද්ධ සමුපකාර බැංකුව විසින් හෝ ඊට විරුද්ධව පවරා ඇති නඩු, අභියාචන හෝ අනෙකුත් නීති කෘත්‍යයන් එම දිනට එක්බිතිවම පෙරාතු දිනයේ අවසන් නොවී පැවතුනේ නම්, ඒවා අවලංගු වන්නේ හෝ අවසන් වන්නේ හෝ ඒවාට හානියක් වන පරිදි ඒවා කෙරෙහි බලපැවැත්වෙන්නේ හෝ නොවේ. ඒවා බැංකුව විසින් හෝ බැංකුවට විරුද්ධව හෝ තත් වූ පරිදි ගෙන යාහැකිය හා ක්‍රියාත්මක විය හැකිය.

25 (අ) බැංකුව විසින් ගනුදෙනු පටන් ගැනීමෙන් පසු කිසිම සමුපකාර සමිතියක් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් ලියා නිදහස් කොට නොමැති නම්, බැංකුවෙහි හැර වෙනත් කුමන වෙළෙඳ බැංකුවක හෝ එහි අරමුදල් තැන්පත් කිරීම හෝ ජංගම හෝ තැන්පතු ගිණුමක් පවත්වාගෙන යාම, නොකළ යුතුය.

(ආ) කිසිම සමුපකාර සමිතියක් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් ලියා නිදහස් කොට නොමැති නම් බැංකුවෙන් හැර වෙනත් කුමන වෙළෙඳ බැංකුවකින් හෝ මැදි කාලීන හෝ දිගු කාලීන ණය ලබානොගත යුතුයි.

26 බැංකුව විසින් යම් පුද්ගලයෙකුට, එම පුද්ගලයා එම ණයප්‍රමාණයා දීමට සුදුස්සෙකු බවට හෝ එම ණය සඳහා ප්‍රමාණවත් ඇපයක් ඇති බවට හෝ එම ණය ඉල්ලීමට අදාළ ක්‍රමය හෝ යෝජනා ක්‍රමය මූදල් අතින් යහපත් බවට මණ්ඩලය සෑහීමකට පත් නොවීනම් එවැනි ණයක් අයිරාවක් හෝ වෙනත් පිළිසරණ ණයක් නොදිය යුතුය.

එසේ වුවද, මුදල් ඇමති වරයාගේද උපදෙස් සහිතව, ඇමතිවරයා විසින් අනුමත කරන්නේ නම් හා යම් ණයක් අයිරාවක් හෝ වෙනත් පිළිසරණ ණයක් ආපසු ගෙවීම පිළිබඳව 21 (1) (ආ) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිවරයා සහතිකයක් දෙන්නේ නම් කුමන සමුපකාර සමිතියකට හෝ අනුමත කළ සමිතියකට හෝ ගොවිකාරක සභාවකට මෙම වගන්තියේ ඉහතකී විධිවිධානයේ අඩංගු අවශ්‍යතා මණ්ඩලයේ තෘප්තියට හේතුවන පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වුවද, එවැනි ණයක් අයිරාවක් හෝ පිළිසරණ ණයක් බැංකුවට දිය හැකිය.

27 යම්කිසි ණයකට අයිරාවකට හෝ පිළිසරණ ණයකට ඇප වශයෙන් ඉදිරිපත් කරන ලද නිශ්චල දේපළක් පිළිගත යුතුදැයි තීරණය කිරීම සඳහා මණ්ඩලයට කිසිම ගාස්තුවක් හෝ අයකිරීමක් නොමැතිව, බදු හෝ වරිපනම් නියම කරන අධිකාරියක තක්සේරු ලැයිස්තුව බැලීමට ඉඩතිබිය යුතුය. එම සෑම අධිකාරියකම නිලධාරීන් විසින්, කුමන නීතියක් යටතේ හෝ වරිපනම් හෝ බදු අය කිරීමට එම අධිකාරියට බලය ඇති දේපළක, තක්සේරුව පිළිබඳ සියලුම විස්තර, මණ්ඩලය විසින් අයැදුම් කළ විට, සැපයිය යුතුය.

28 1 (අ) බැංකුව විසින් ණයක් අයිරාවක් හෝ වෙනත් පිළිසරණ ණයක් දෙනු ලැබූ හෝ

(ආ) බැංකුව විසින් ණයක්, අයිරාවක් හෝ වෙනත් පිළිසරණ ණයක් දෙනු ලැබූ අයෙකුගේ බූදලයක අන්තිම කැමති පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාත් බල කඩදාසි ලැබූ හෝ මණ්ඩලය විසින් ඒ සඳහා අයැදුම් කළ විට, එම බූදලය නියෝජනය කිරීම සඳහා පත් කළ හෝ

(ඇ) යම් ණයක් අයිරාවක් හෝ පිළිසරණ ණයක් සඳහා එම බැංකුවට උකස් කර ඇතිනිශ්චල දේපළක කුමන අයිතියක් හෝ හිමිකමක් හෝ අයිතිවාසිකමක්, සෙවණාවෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් ලද සෑම අයෙකුම, ඔහුට සියලුම දැන්වීම් කළ යුතු ලිපිනයත් බැංකුවේ ලියා පදිංචි කළ යුතුය.

(2) 1 වැනි උප වගන්තිය බලපවත්වන පුද්ගලයෙකුට බාරදීමට අවශ්‍ය යම් දැන්වීමක් එම උප වගන්තිය යටතේ එම පුද්ගලයා විසින් ලියාපදිංචි කළ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවන්නේ නම්, විධිමත් පරිදි බාරදුන්නා සේ සැලකිය යුතුය. තැපෑලෙන් සිරිත් පරිදි ලිපිය බාරදෙන අවස්ථාවෙහි එම දැන්වීම බාරදුන්නා සේ සැලකිය යුතුය.

එසේ වුවද, යම් පුද්ගලයෙක් 1 වැනි උප වගන්තිය යටතේ ලිපිනයක් ලියාපදිංචි නොකරත් නම් බැංකුව විසින් ගැසට් පත්‍රයේ හා දිනපතා පත්‍රයක ඔහුට යොමු කළ දැන්වීමක් පළකළ යුතුය. එවැනි දැන්වීම් එය පළකළ අන්තිම දිනයෙහි, ඔහුට බාරදුන්නා සේ සැලකිය යුතුය.

29 යම්කිසි දේපළක් උකසට ගෙන බැංකුව විසින් දෙනලද ණයක්, අයිරාවක්, හෝ වෙනත් පිළිසරණ ණයක් ආපසු ගෙවීමේ කොටස වශයෙන් ගෙවිය යුතු හෝ එම ණයෙහි අයිරාවෙහි, හෝ පිළිසරණ ණයෙහි පොලී වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම කඩකර තිබේනම්, එය එම ණයෙහි, අයිරාවෙහි හෝ පිළිසරණ ණයෙහි නොගෙවා ඇති මුළු කොටස හෝ ඒ සඳහා අයවිය යුතු පොලිය ගෙවීම, කඩකිරීමක් සේ සැලකිය යුතුය.

30 29 වැනි වගන්තිය යටතේ යම්කිසි මුදලක් සම්බන්ධව කඩකිරීමක් සිදුවී ඇත්නම් 1943 අංක: 19 දරන කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතන ආඥපනතේ 68 සිට 83 (මේ දෙක ද ඇතුළුව) දක්වා වූ විධිවිධාන එම ආකාරයෙන්ම එම විධිවිධාන මේ පනතේ කොටසක් ලෙස සලකා ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් බලපැවැත්විය යුතුය. එම විධිවිධාන බලපැවැත්වීමේදී පහත දැක්වෙන අන්දමින් බලපැවැත්විය යුතුය.

(අ) එහි 'මණ්ඩලය' වෙනුවෙන් කරන සෑම සඳහනක්ම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට කරන සඳහනක් සේ සැලකීම;

(ආ) එහි 'ආයතනය' යනුවෙන් කරන සෑම සඳහනක්ම බැංකුවට කරන සඳහනක් සේ සැලකීම;

(ඇ) එහි 'ණය' යනුවෙන් කරන සෑම සඳහනක්ම, ණයකට, අයිරාවකට හෝ වෙනත් පිළිසරණ ණයකට කරන සඳහනක් සේ සැලකීම.

(ඈ) එහි 'ආඥපනත' යනුවෙන් කරන සෑම සඳහනක්ම මෙම පනතට කරන සඳහනක් සේ සැලකීම.

(ඉ) එම විධිවිධානයන්හි 72 වැනි වගන්තියෙහි '62 වගන්තියට' කරන සඳහන මෙම පනතෙහි 28 වැනි වගන්තියට කරන සඳහනක් සේ සැලකීම; සහ

(ඊ) එම විධිවිධානයන්හි 79 (3) වගන්තියෙහි "උපලේඛනයෙහි (ආ) ෆෝර්මය යන්නට කරන සඳහන" නියම කිරීමට හැකි එම ෆෝර්ම "යන්නට කරන සඳහනක් සේ සැලකීම සහ එම වගන්තියේ උප ලේඛනයෙහි (ඇ) 'ෆෝර්ම යන්නට කරන සඳහන නියම කිරීමට හැකි යම් ෆෝර්ම" යන්නට කරන සඳහනක් සේ සැලකීම.

31 බැංකුව විසින් දෙනු ලබන දිගුකාලීන හා මැදිකාලීන ණය දිය යුත්තේ රජය විසින් 15 (1) ආ වගන්තිය යටතේ හෝ, 20 වැනි වගන්තිය යටතේ ණයකර නිකුත් කොට ලබාගන්නා මුදලිනි.

32 (1) බැංකුවේ සාමාන්‍යාධිකාරී වරයෙක් සිටිය යුතුය. ඔහු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු අතර, ඔහු විසින් මණ්ඩලයේ සාමාන්‍ය පරිපාලනය හා පාලනය යටතේ බැංකුවේ කටයුතු කළ යුතුය.

(2) මණ්ඩලයට කුමන බලතයක් හෝ කාර්යයක් බැංකුවේ කුමන නිලධාරියෙකුට හෝ පැවරිය හැකිය. එම නියෝජනය පුද්ගලයන් සම්බන්ධයෙන් හෝ කරුණු සම්බන්ධයෙන්, අඩ වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ අවලංගු කිරීමට බැංකුවට හැකිය.

(3) මණ්ඩලය විසින් මෙම වගන්තිය යටතේ යම් බලතල හෝ කාර්යයන් නියෝජනය කරනු ලැබූ නිලධාරියා ඔහුගේ බලතල හෝ කාර්යයන් ඉටුකිරීමේදී මණ්ඩලයේ විධානයන්ට අනුකූලව ඒවා ඉටුකළ යුතුය. එම නිලධාරියා විසින් වෙනත් ලෙස නොව, එවැනි විධානයන්ට අනුකූලව, සහ ඔහුට නියෝජනය කරන ලද කාර්යයන් සපුරා ලීමේ දී කරන ලද සියලුම ක්‍රියා, ඒවා මණ්ඩලය විසින් කරන ලද්දක් සේ එම බලය සහිතව, ක්‍රියාත්මක විය යුතුය.

33 මණ්ඩලය විසින් තීරණය කරන ස්වරූපය, හා ආකාරය අනුව ගිණුම් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් සැලසිය යුතුය.

34 (1) එක් එක් මුදල් වර්ෂයෙහි බැංකුවේ ගිණුම් ඊට පසුව එන වර්ෂයෙහි ජූනි මස තිස්වෙනිදාට පෙරාතුව පරීක්ෂා කිරීම සඳහා ඔඩිටර් ජනරාල් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම ගිණුම් පරීක්ෂා කර බැලීම සඳහා ඔහුට ආධාර පිණිස ඔහුගේ පාලනය හා විධානය යටතේ වැඩ කිරීම සඳහා, සුදුසුකම් සහිත කුමන ගණන් පරීක්ෂක වරයෙකු හෝ ගණන් පරීක්ෂකවරයන් සේවයෙහි යෙදවිය හැකිය.

(2) බැංකුවේ ගිණුම් පරීක්ෂා කර බැලීමේදී ඔඩිටර් ජනරාල්වරයා විසින් දරන වියදම් සඳහා මුදල් ඇමතිවරයාගේ ද සම්මුතිය ඇතිව ඇමති-වරයා විසින් තීරණය කරන පාරිශ්‍රමිකයක් ඔඩිටර් ජනරාල්වරයාට ගෙවිය යුතුය. ඔඩිටර් ජනරාල්වරයා විසින් බැංකුවෙන් ලබන පාරිශ්‍රමිකය, ගණන් පරීක්ෂාව සඳහා යොදා ගන්නා ලද, සුදුසුකම් සහිත යම් ගණන් පරීක්ෂකයෙකුට යවන ලද මුදල් අඩුකොට, ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුය.

(3) ගණන් පරීක්ෂණය සඳහා අවශ්‍ය යයි ඔඩිටර් ජනරාල්වරයා විසින් අදහස් කරන බැංකුවේ සියලුම පොත්, ඔප්පු, කොන්ත්‍රාත්තු, ගිණුම්, වවුචර හා අනෙකුත් ලියවිලි පරීක්ෂණයේදී, ඔඩිටර් ජනරාල්වරයාට හෝ ඔහුට සහාය වන පුද්ගලයාට බැලීමට ඉඩදිය යුතුය. ඒවා මණ්ඩලය හා බැංකුව විසින් එම කාරණයට අදාළ ඔවුන් දන්නා තොරතුරු සමග සැපයිය යුතුය.

(4) ඔඩිටර් ජනරාල්වරයා විසින් බැංකුවේ ගිණුම් පරීක්ෂා කොට,

(අ) ඔහු විසින් ඔහුට අවශ්‍ය සියලුම තොරතුරු හා විස්තර ලබාගත්තේ ද නොගත්තේ ද යන වග දක්වමින්,

(ආ) බැංකුවේ කටයුතු සත්‍ය ලෙසත් සාධාරණ ලෙසත් පිළිබිඹුවන පරිදි වාර්තාවේ සඳහන් ගිණුම් සකස් කොට ඇත්තේ ද යන වග දක්වමින්,

(ඇ) යම් බැංකුවේ ගිණුම් හා කටයුතු පරීක්ෂා කිරීමක දී ඔහුගේ අදහස අනුව උත්තර මන්ත්‍රී මණ්ඩලයට හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ප්‍රයෝජනවත් යයි සැලකිය හැකි ගිණුම්හි යම් ශීර්ෂයකට අවධානය යොමු කරමින්, වාර්තාවක් සැපයිය යුතුය.

(5) ඔඩිටර් ජනරාල්වරයා විසින් මණ්ඩලයට ඔහුගේ වාර්තාව යැවිය යුතුය.

(6) මෙම වගන්තියේ පරමාර්ථයන් සඳහා "සුදුසුකම් ලත් ගණන් පරීක්ෂක" යන ප්‍රකාශයෙන් අදහස් කරනුයේ ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු හා 1938 අංක: 51 දරන වෙළෙඳ සමාගම් ආඥා පනත යටතේ, ගණන් පරීක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වූ අයෙකි.

35 (1) කුමන අවුරුද්දක් හෝ සම්බන්ධව ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාව ලැබුන විට මණ්ඩලය විසින් එම අවුරුද්දට අදාළ පහත දක්වෙන ලියවිලි ඇමතිවරයාට සහ මුදල් ඇමතිවරයාට ඉදිරිපත් කිරීමට කටයුතු සැලසිය යුතුය.

(අ) ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාව.

(ආ) ශෙෂ පත්‍රය.

(ඇ) බැංකුවේ කටයුතු පිළිබඳව මණ්ඩලයේ වාර්තාව.

(2) මෙම වගන්තියේ 1 වැන උප වගන්තිය යටතේ ඇමතිවරයාට එවන ලද ලියවිලිවල පිටපත් ඇමතිවරයා විසින් උත්තර මන්ත්‍රී මණ්ඩලයට හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

(3) කුමන මුදල් වර්ෂයක් හෝ පිළිබඳව ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාව ලැබුනවිට මණ්ඩලයේ සභාපතිවරයා විසින් අප්‍රමාදව බැංකුවේ සාමාන්‍ය මණ්ඩලයේ රැස්වීමක් කැඳවිය යුතුය. එම රැස්වීමේදී සලකා බැලීම සඳහා 1 වැන උප වගන්තියේ (ආ) සහ (ඇ) යන ශීර්ෂයන්හි සඳහන් කර ඇති ලියවිලි එම වාර්තාව සමග ඉදිරිපත් කළ යුතුය.

36 (1) බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට හෝ ගණකාධිකාරිවරයාට හෝ ඒ වෙනුවෙන් සාමාන්‍යාධිකාරි වරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් නිලධාරියෙකුට හෝ

(අ) බැංකුවෙන් හෝ බැංකුවෙන් ණයක්, අයිරාවක් හෝ වෙනත් පිළිසරණයක් ලැබූ සමුපකාර සමිතියකින් හෝ ණය ලබාගත් සමුපකාර සමිතියක හෝ වෙනත් පුද්ගලයෙකුගේහෝ පොත් හා ගිණුම් පරීක්ෂාකර බැලීමට;

(ආ) එම පුද්ගලයා හෝ සමුපකාර සමිතියේ කටයුතු පිළිබඳව සැබෑ තත්ත්වය දැන ගැනීම සඳහා මෙම උප වගන්තියේ (අ) ඡේදයේ පළමුවෙන් සඳහන් කළ සමුපකාර සමිතියක හෝ සමුපකාර සමිතියක සේවකයෙකු, සාමාජිකයෙකු, හෝ නිලධාරියෙකු හෝ වෙනත් පුද්ගල-යෙකු පරීක්ෂාකර බැලීමට;

(ඇ) එම ඡේදයේ සඳහන් කර ඇති කරුණ සඳහා අවශ්‍ය විධානය කරන බැංකුවේ නිලධාරියාට අවශ්‍ය තොරතුරු මෙම උප වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සේවකයෙකු, සාමාජිකයෙකු, හෝ නිලධාරියෙකු විසින් සැපයිය යුතු යයි විධානය කිරීමට සහ

(ඈ) යම්නිලධාරියෙකු, සාමාජිකයෙකු හෝ සේවකයෙකු වෙත තිබෙන එම ඡේදයේ සඳහන් කරන කරුණ සඳහා විධානය කරන බැංකුවේ නිලධාරියා විසින් අවශ්‍ය යයි සලකන තොරතුරු ඇතුළත් වී තිබේයයි සැලකිය හැකි පොත්, වාර්තා සහ අනෙකුත් ලියවිලි, මෙම උප වගන්-තියේ (ආ) ඡේදයේ සඳහන් සේවකයෙකු, සාමාජිකයෙකු හෝ නිල-ධාරියෙකු විසින් සැපයිය යුතු යයි විධාන කිරීමට හැකිය.

(2) පළමුවැනි උප වගන්තියෙන් පවරා ඇති බලතල දරන බැංකුවේ සෑම නිලධාරියෙක්ම ශපත කිරීමේ ආඥාපනතේ පරමාර්ථයන් සඳහා, එම බලතල දරනු ලබන සමුපකාර සමිතියේ කටයුතු සම්බන්ධව සාක්ෂි ඇසීමට නීතියෙන් බලය ලත් පුද්ගලයෙකු ලෙස සැලකිය යුතුය.

(3) සාධාරණ හේතුවක් නොමැතිව 1 වැනි උප වගන්තිය යටතේ යම් පුද්ගලයෙකු පරීක්ෂා කිරීමේ දී අසනු ලබන කුමන ප්‍රශ්නයකට උත්තර දීම හෝ පරීක්ෂා කර බැලීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ අපොහොසත් වීම හෝ ඉටු නොකිරීම කිසිවකු විසින් නොකළ යුතුය.

(4) කිසිම පුද්ගලයෙකු තොරතුරු සැපයීමේදී හෝ 1 වැන වගන්තිය යටතේ පොත්, වාර්තා හා අනෙකුත් ලියවිලි සැපයීමේදී ඔහු විසින් අසත්‍ය හෝ වැරදි යයි දන්නා තොරතුරු හෝ ප්‍රකාශ අඩංගු පොත්, වාර්තා හෝ අනෙකුත් ලියවිලි ඉදිරිපත් නොකළ යුතුය.

(5) 1 වැනි උප වගන්තියෙන් පවරා ඇති බලතල දැරීමේදී කිසිම පුද්ගල-යෙකු, බැංකුවේ නිලධාරියෙකුට බාධා නොකළ යුතුය.

37. 36 වැන වගන්තිය යටතේ යම්කිසි සමුපකාර සමිතියක කටයුතු පරීක්ෂා කර බැලීමෙන් පසුව එම සමුපකාර සමිතිය වස්තු භංගත්වයට පැමිණ තිබේ යයි හෝ එහි ගනුදෙනු තව දුරටත් කරගෙන යාමෙන් එහි ණය කරුවන්ට පාඩුවක් සිදුවේයයි සාමාන්‍යාධිකාරි වරයා ඒත්තු ගත්තේ නම් ඔහු එම සමුපකාර සමිතියේ කටයුතු පිළිබඳව වාර්තාවක් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. මණ්ඩලය විසින් එම වාර්තාව සලකා බැලීමෙන් පසුව එම සමුපකාර සමිතිය විසුරුවා හැරීම සහ ඈවර කිරීම සුදුසු යයි සිතන්නේ නම් එසේ කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස් වරයාට නිර්දේශ කළ යුතුය.

38. මෙම පනතේ කුමන හෝ විධානයක් ඉටු කිරීමට අපොහොසත් වන හෝ උල්ලංඝනය කරන සෑම පුද්ගලයෙකුම වරදකට වරදකරු විය යුතුය.

39. මෙම පනත යටතේ වරදකට වරදකරු වන සෑම පුද්ගලයෙකුම මහෙස්ත්‍රාත් වරයෙකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු වූවිට රු. 500/= කට නොවැඩි දඩයකට හෝ දෙවර්ගයෙන් කුමන වර්ගයක හෝ මාසයකට නොවැඩි සිර දඬුවමකට හෝ දඩය හෝ සිර දඬුවම යන දෙකටම හෝ යටත් විය යුතුය.

40. මෙම පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් යම් වරදක් කරනු ලැබූ විට,

(අ) එම පුද්ගල මණ්ඩලය බලය ලත් සංස්ථාවක් නම් එම බලය ලත් සංස්ථාවේ සෑම අධ්‍යක්ෂ වරයෙකුම හා නිලධාරියෙකුම,

(ආ) පුද්ගල මණ්ඩලය වෙළෙඳ සමාගමක් නම් එම වෙළෙඳ සමාගමේ සෑම හවුල් කරුවෙක්ම එම වරදට වරදකරු ලෙස සැලකිය යුතුය.

එසේ වුවද, එවැනි අධ්‍යක්ෂ වරයෙකු හෝ නිලධාරියෙකු හෝ හවුල් කරුවකු එම වරද සිදු කරන ලද්දේ ඔහුගේ දැනුම නොමැතිව යයි හෝ ඔහු විසින් එම වරද කරනු වැළැක්වීම සඳහා අතලස්ව සියලුම කටයුතු කළේ යයි ඔප්පු කළහොත් එවැනි අධ්‍යක්ෂ වරයෙකු නිලධාරියෙකු හෝ හවුල් කරුවකු වරද කරුවකු ලෙස නොසැලකිය යුතුය.

41. වෙනත් කුමන ලිඛිත නීතියක කෙසේ තිබුන ද

(අ) බැංකුවේ ලාභ හා ආදායම පිළිබඳව ආදායම් බදු ගෙවීමෙන් බැංකුව නිදහස්විය යුතුය.

(ආ) මණ්ඩලය හෝ බැංකුවවෙනුවෙන් හෝ ඒවා සඳහා හෝ ලියන නීත්‍යානුකූල ලියවිලි වලට එවැනි නීත්‍යානුකූල ලියවිලි සම්බන්ධයෙන් නිදහස් කිරීමක් නොහැකි නම් මණ්ඩලයට හෝ බැංකුවට ගාස්තුවක් ගෙවීමට සිදුවන විටදී, මණ්ඩලය හා බැංකුව මුද්දර ගාස්තු ගෙවීමෙන් නිදහස් විය යුතුය.

42. බැංකුව විසින් සමුපකාර සමිතියකට ණයක්, අයිරාවක් හෝ වෙනත් පිළිසරණ ණයක් දුන්නේ නම්, ඉන් පසුව සමුපකාර සමිති ආඥා පනතේ 35 (ආ) වගන්තිය යටතේ එම සමුපකාර සමිතියේ කමිටුව විසුරුවා හැරියේ නම් බැංකුව

(අ) එම වගන්තියේ 1 වැන උප වගන්තියේ පරමාර්ථයන් සඳහා සුදුසු පුද්ගලයෙකු

(ආ) එම වගන්තියේ 3 වැන උප වගන්තියේ පරමාර්ථයන් සඳහා සුදුසු හා තිසි පුද්ගලයෙකු

විය යුතුය.

43. (1) ඇමතිවරයාට මෙම පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන පැනවිය හැකිය.

(2) පළමුවැනි උප වගන්තියෙන් පවරා දෙන බලතලවල සාමාන්‍යභාවයට හානියක් නොවන පරිද්දෙන් හා විශේෂයෙන් පහත දැක්වෙන කරුණු පිළිබඳව ඇමතිවරයාට නියෝග සකස් කළ හැකිය.

(අ) මෙම පනතින් නියම කිරීමට ඇති හෝ මෙම පනතින් බලය දී ඇති මෙම පනතින් අවශ්‍ය නියෝග පිළිබඳව හෝ,

(ආ) බැංකුවේ කොටස් සඳහා අයැදුම් කරන ආකාරය, එවැනි කොටස් දරන්නන් ලියා පදිංචි කිරීම, කොටස් සහතික නිකුත් කිරීම හා අළුත් වැඩියා කිරීම එවැනි කොටස් පවරා දීම හෝ කොටස් වලට සම්බන්ධිත ඉහතකී කරුණු වලට අදාළ හෝ ඊට අමතර වෙනත් කරුණු,

(ඇ) ණයකරවල ස්වරූපය, ඒවාට ගෙවිය යුතු පොළී, ණයකර බේරීමේ කාලය හෝ කාලසීමා හා ආකාරය, ණයකර පවරා දීම හා ණයකරවල සම්බන්ධිත ඉහතකී කරුණුවලට අදාළ හෝ ඊට අමතර කරුණු,

(ඈ) බැංකුව විසින් කරන ලද සේවා සඳහා පුද්ගලයන් විසින් ගෙවිය යුතු ගාස්තු

(3) මෙම වගන්තිය යටතේ ඇමතිවරයා විසින් තොදී සකස් කරන කිසිම නියෝගයක් එය උත්තර මන්ත්‍රී මණ්ඩලය හා මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කොට එවැනි අනුමැතිය ගැසට් පත්‍රයේ පලකොට දක්වනතුරු ක්‍රියාත්මක නොවිය යුතුය.

44 සමූපකාර සමිති ආඥාපනතේ පටහැනිව කුමක් තිබුනද, මෙම පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක විය යුතුය.

45 (1) 1958 අංක: 51 දරන වෙලෙඳ සමාගම් ආඥාපනතේ විධිවිධාන බැංකුව කෙරෙහි බලනොපැවැත්විය යුතුය.

(2) 1 වැන උප වගන්තියේ කෙසේ තිබුනද, ඇමතිවරයා විසින් අවස්ථානුකූලව සුදුසුයයි හැගේනම් ආඥාවකින් එම ආඥාවෙහි නියම කැරෙන 1958 අංක:51 දරන වෙලෙඳ සමාගම් ආඥාපනතෙහි කුමන විධිවිධානයක් හෝ බැංකුව කෙරෙහි බලපැවැත්විය යුතුයයි ඇමතිවරයාට ප්‍රකාශ කළ හැකිය මෙම උප වගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවකටම නීතියේ බලය තිබිය යුතුය.

46 සීමාසහිත ලංකාවේ සමූපකාර ඒකාබද්ධ බැංකුව විසුරුවා හැරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, 1949 අංක: 21 දරන පනතින් සංශෝධිත සමූපකාර සමිති ආඥාපනත එම ආඥාපනතේ 35 (අ) වගන්තිය, එම වගන්තියේ 7 වැනි උප වගන්තියෙහි "සීමාසහිත ලංකා සමූපකාර ඒකාබද්ධ බැංකුව" යන වචන වෙනුවට "මහජන බැංකුව" යන වචන යෙදීමෙන් තවදුරටත් සංශොධනය කරනු ලැබේ·

47 සීමාසහිත ලංකා සමූපකාර ඒකාබද්ධ බැංකුව විසුරුවා හැරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, 1947 අංක: 39 දරන සීමාසහිත ලංකා සමූපකාර ඒකාබද්ධ බැංකු (මුදල් ආධාර) පනත මෙයින් අවලංගු කරනු ලැබේ.

48 මේ පනතෙහි පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අදහස් නොවේ නම්, "අනුමත කළ සමිති" යනුවෙන් අදහස් කරනුයේ ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන ආඥාවකින් මෙම පනතේ පරමාර්ථයන් සඳහා අනුමත කරන ලද සමිතිය.

"වෙළෙඳ බැංකුව" යන්නෙහි අදහස 1949 අංක: 58 දරන මුදල් නීති පනතේ අදහස විය යුතුය.

"සමූපකාර බැංකුව" යන්නෙන් අදහස් කරනුයේ, සමූපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කළ සමූපකාර සමිතියක් වන සමූපකාර බැංකුවකි.

"සමූපකාර සමිතිය" යනුවෙන් අදහස් කරනුයේ සමූපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කළ සමූපකාර සමිතියයි.

"ගොවිකාරක සභා'' යන්නෙහි අදහස 1958 අංක: 1 දරන කුඹුරු පනතේ අදහස විය යුතුය.

"බැංකුවේ සාමාන්‍ය මණ්ඩලය" යනුවෙන් අදහස් කරනුයේ මෙම පනතේ 9 වැනි වගන්තියේ විධිවිධාන අනුව සැකසුන බැංකුවේ සාමාන්‍ය මණ්ඩලයයි.

"දිගුකාලීන ණය" යනුවෙන් එම ණය දුන් දින සිට අවුරුදු 10 කට කලින් ආපසු නොගෙවන ණය ගැනෙයි.

"මැදිකාලීන ණය" යනුවෙන් ණය දුන් දින සිට අවුරුදු පහකට කලින් නොගෙවන, අවුරුදු දහයකට පෙර ගෙවන ණය ගැනෙයි.

"කොටස්" යනුවෙන් බැංකුවේ ප්‍රාග්ධන කොටස් ගැනෙයි.

"කෙටි කාලීන ණය" යනුවෙන් දුන් දින සිට අවුරුදු පහකට පෙර ආපසු ගෙවන ණය ගැනෙයි:

## 1961 අංක 30 දරන විනිමය බිල්පත් (සංශෝධන) පනත

2. මෙහි මින්මතු "ප්‍රධාන පනත" යනුවෙන් හඳුන්වනු ලබන විනිමය බිල්පත් පනතෙහි 14 වැනි වගන්තිය, ඒ වගන්තියේ 4 වැනි ඡේදයෙහි term "month" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

'term "month" හෝ "මාසය" හෝ "மாசம்"'

3. ප්‍රධාන පනතෙහි 35 වැනි වගන්තිය ඒ වගන්තියෙහි (1) වැනි උප වගන්තියේ 'යම් බිල්පතක්'යන වචන වල පටන් එම වගන්තියේ අවසානය තෙක් ඇති සියලුම වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"Pay D only" හෝ "ඩී ට පමණක් ගෙවනු" හෝ "டிக்கு மாத்திரம் கொடுக்க;" හෝ.

"Pay D for the account of X" හෝ "එක්ස්ගේ ගණනට ඩී ට ගෙවනු" හෝ X "இன் கணக்கில் டிக்—க்கொடுக்க", හෝ.

"Pay D or order for collection" හෝ "ඩී ට හෝ අණපරිදි හෝ ගෙවනු" හෝ "டிக்கு அல்லது அவரின் கட்டளைப்படி கொடுக்க."

යනුවෙන් බිල්පතක් පිටසන් කර ඇත්නම්,

4. ප්‍රධාන පනතෙහි 76 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) එකී වගන්තියෙහි (1) උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්.

(1) චෙක් පතක මුහුණතේ හරහට ඇඳි සමාන්තර අමතර ඉරි දෙකක් "Not Negotiable" හෝ "ගනුදෙනු කළ නොහැකිය" හෝ "கை மாறத்தகாத" යන වචන සහිතව හෝ රහිතව ඇති කල්හි එය රේඛිත කැරීමක් ලෙසට ද එම චෙක්පත සාමාන්‍යයෙන් රේඛිත චෙක් පතක් ලෙසට ද සලකනු ලැබේ;

(ආ) එම වගන්තියෙහි (2) උප වගන්තිය '"Not Negotiable" යන වචන සහිතව හෝ රහිතව' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්.

"Not Negotiable" හෝ "ගනුදෙනු කළ නොහැකිය" හෝ "கை மாறத் தகாத" යන වචන සහිතව හෝ රහිතව

5. ප්‍රධාන පනතෙහි 77 වැනි වගන්තිය, (4) වැනි උප වගන්තියේ '"Not Negotiable"' යන වචන එකතු කරන්න"' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

'"Not Negotiable" හෝ "ගනුදෙනු, කළ නොහැකිය" හෝ "கை மாறத்தகாத"යන වචන එකතු කරන්න'.

6. (1) ප්‍රධාන පනතෙහි 81 වැනි වගන්තිය, '"Not Negotiable" යන වචය 'එහි තිබෙන විට ඔහුට' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන' ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"Not Negotiable" හෝ "ගණුදෙනු, කළ නොහැකිය " හෝ "கை மாறத்த காத' යන වචන එහි තිබෙන විට, ඔහුට'

(2) ප්‍රධාන පනතෙහි 81 වැනි වගන්තියේ තීරු සටහන, '"Not Negotiable' යන වචන සමග,' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

'"Not Negotiable" "හෝ ගනුදෙනු කළ නොහැකිය. " හෝ "கை மறத்தகாத" යන වචන සමග,'

## 1961 අංක 51 දරන බදු සංචිත සහතික (සංශෝධන) පනත.

1. මේ පනත 1961 අංක 51 දරන බදු සංචිත සහතික (සංශෝධන) පනත වශයෙන් හැඳින්විය හැකිය.

2. 1957 අංක 22 දරන බදු සංචිත සහතික පනතෙහි 6 වැනි වගන්තිය මෙයින් අවලංගු කොට පහත දැක්වෙන අළුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ-

6. (1) මෙම පනත යටතේ නිකුත් කිරීමට බලය දෙනු ලැබූ සහතික පිළිබඳ පොලී ප්‍රමාණය, ගැසට් පත්‍රයේ පළ කරන ආඥාවකින් කලින් කල නියම කිරීමට මුදල් ඇමතිවරයාට හැකිය.

(2) 5 වැනි වගන්තිය යටතේ ආපසු භාරදුන් යම් සහතිකයක් ආපසු භාරදීමේ වටිනාකම, එම සහතික වර්ගයෙහි වටිනාකමත්, එම වර්ග වටිනාකම අනුව එම සහතිකයේ දින සිට බදු අය කෙරෙන දින තෙක් කාලය තුළ එක් එක් පූර්ණ මාසයක් සඳහා සහතිකයේ දිනයෙහි වලංගුව තිබූ 1 වැනි උප වගන්තිය යටතේ ආඥාවෙහි නියම කරනු ලැබූ පොලී ප්‍රමාණය අනුව හෝ එවැනි ආඥාවක් සහතිකයෙහි දක්වා ඇති දිනයෙහි වලංගුව නොපැවතියේ නම්, සියයට එකක් වූ පොලී ප්‍රමාණය අනුව ගුණනය කරනු ලැබූ පොලියත් යන මුළු ප්‍රමාණය විය යුතුය.”

## 1961 අංක 65 දරන මූල්‍ය පනත.

### 1 වැනි කොටස

# ලංකා බැංකුව ජනසතු කිරීම.

2. ලංකා බැංකුවේ සියලුම (මෙම පනතේ මෙම කොටසෙහි "බැංකුව" යනුවෙන් සඳහන් කැරෙන) සාමාන්‍ය කොටස්, අදාළ දිනයෙහි රජය කෙරෙහි පැවරුන බව සැලකිය යුතු අතර ඒ අනුව එම දිනයෙහි සිට රජය එම කොටස් දරනු ලැබූ බවත් දරනු ලබන බවත් සැලකිය යුතුය.

3 i. රජය කෙරෙහි පැවරුනේ යයි සැලකෙන බැංකුවේ සෑම සාමාන්‍ය කොටසක් සම්බන්ධයෙන්ම එවැනි පැවරීම කළ දිනට එක්බිතිවම පෙරාතු දිනයෙහි එම කොටස දරූ තැනැත්තා එකී කොටස සඳහා ගෙවූ මිල අනුව හෝ එම තැනැත්තා එම කොටස දරන ලද්දේ යම් කිසි විකිණීම ප්‍රතිඥාවක් අනුව අයත් කර ගැනීමෙන් නොව, එවැනි ප්‍රතිඥාවක් නොමැතිව නීතිය ක්‍රියාත්මක වීමකින් හෝ ස්වේච්ඡා පැවරීමකින් නම්, එම කොටස, යම්කිසි ප්‍රතිඥාවක් අනුව කලින් දරූ තැනැත්තා ලබාගෙන තිබුනේ නම්, එකී මිල අනුව වන්දි ගෙවිය යුතුය.

ii. රජය කෙරෙහි පැවරුනේ යයි සැලකෙන බැංකුවේ සාමාන්‍ය කොටස් පිළිබඳව වන්දි, මුදලෙන් හෝ 5% හේ ගනු දෙනු කළහැකි රජයේ ව්‍යාපාර වස්තු වලින් හෝ ඇමතිවරයා විසින් තීරණය කෙරෙන යම් ප්‍රමාණයක මුදලින් හා යම් ප්‍රමාණයක ව්‍යාපාර වස්තු වලින් ගෙවිය යුතුය. එම ව්‍යාපාර වස්තු, ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා සුරැකුම් පත් ආඥා පනත යටතේ නිකුත් කළා සේ සැලකිය යුතුය. එවැනි ව්‍යාපාර වස්තු බේරීමේ කාලය අවුරුදු 10 ක් විය යුතුය.

iii. 2 වැනි උප වගන්තිය යටතේ වන්දි වශයෙන් ව්‍යාපාර වස්තු නිකුත් කරනු ලැබූ කිසිම අයෙකුට ත්‍යාගයක් වශයෙන් හෝ අන්තිම කැමැත්ත අනුව හෝ හැරෙන්නට එවැනි ව්‍යාපාර වස්තු මුළු මනින්ම හෝ කොටසක් හෝ අන්සතු කිරීමට හිමිකමක් නොතිබිය යුතුය.

iv. මෙම පනතේ මේ කොටස යටතේ යම් පුද්ගලයෙකුට ගෙවිය යුතු වන්දි ප්‍රමාණය පිළිබඳව බැංකුව හෝ එම පුද්ගලයා අතර ආරාවුලක් වුවහොත් එය බැංකුව විසින් ඇමතිවරයාට ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳව ඇමතිවරයාගේ තීරණය අවසන් තීරණය විය යුතුය.

4. රජය කෙරෙහි පැවරුනේය යි සැලකෙන කොටස් පිළිබඳව ගෙවිය යුතු වන්දි ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අයවිය යුතුය.

5. භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ඒ වෙනුවෙන් නිකුත් කෙරෙන විශේෂ හෝ සාමාන්‍ය විධිවිධානවලට අනුරූපව හෝ යටතේ පමණක් හැරෙන්නට, අදාළ දිනයෙන් පටන් ගෙන මෙම පනත පවත් ගැනීමට එක්බිතිවම පෙරාතුව අවසන් වන කාලය තුළදී, මෙහින් මතු නියම කැරෙන යම් යම් වර්ග වල ගනු දෙනු සඳහා බැංකුවට බලය නොමැතිසේ සැලකිය යුතුය. මේ අනුව මේ වගන්තියේ ඉහත දැක්වූ විධිවිධානයන්ට පටහැනි වන යම් ගනු දෙනුවල බැංකුව යෙදුනේ නම්, එවැනි ගනුදෙනු අවලංගු විය යුතු හා නිෂ්ප්‍රභා විය යුතුය.

(අ) ණය හා අත්තිකාරම් ගනුදෙනු කිරීම.

(ආ) ණය ගැනීම හෝ ණය ලබා ගැනීම.

(ඇ) වෙනත් යම් ව්‍යාපාරයක් අයත් කර ගැනීම.

(ඈ) ලාභ බෙදා ගැනීම, ප්‍රයෝජන එකරාශි කිරීම, සමුපකාරය, හවුල් ව්‍යාපාර කටයුතු, අන්‍යොන්‍ය පහසුකම්, හෝ වෙනත් අන්දමේ ගනු දෙනු සඳහා වෙනත් කුමන පුද්ගලයෙකු සමග හෝ කටයුතු පිළියෙළ කරගැනීමට, ඇතුළත්වීම.

(ඉ) බැංකුවේ පූර්ණව්‍යාපාරය හෝ එයින් කොටසක් විකිණීම හෝ වෙනත් පරිදි සුදුස්සක් කිරීම.

6. අදාළ දිනයේ පටන් ගෙන මෙම පනත පටන් ගැනීමට එක්බිතිවම පෙරාතුව දිනයෙන් අවසන් වුනු කාලය තුලදී සිදුවූ බැංකුවේ සාමාන්‍ය කොටස් පිළිබඳව කුමන අන්දමක හෝ විකිණීමක් හෝ පැවරීමක් හෝ, වෙනත් කටයුත්තක්, එවැනි කොටස් සඳහා ලාභාංශ ගෙවීමක් සහ ප්‍රකාශ කිරීමත්, ණයකර නිකුත් කිරීමක් සහ බැංකුවේ ආයෝජන විකිණීම හෝ වෙනත් අන්දමකින් සුදුස්සක් කිරීමට අදාළ කුමණ ගනුදෙනුවක් සඳහා හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය ලෙස සැලකිය යුතුය. ඒ අනුව සකස්කළ, ඇතුළත්වූ හෝ ක්‍රියාත්මක කරන ලද එවැනි ගනුදෙනු, ප්‍රකාශ, ගෙවුම්, හා නිකුත් කිරීම් මේ වගන්තියේ යටකී විධිවිධානයන්ට පටහැනි වන සේ සිදුකරන ලද්දේ නම් ඒවා අවලංගු හා නිෂ්ප්‍රභා වූවා සේ හා වන සේ සැලකිය යුතුය.

7. අදාළ දිනයෙන් පටන් ගෙන මෙම පනත පටන් ගැනීමට එක්බිතිවම පෙරාතුවූ දිනයෙන් අවසන්වූ කාලයතුළ, බැංකුවේ අධ්‍යක්ෂවරු, බැංකුවේ ගනු දෙනු රජය වෙනුවෙන් හා සඳහා කළාසේ සැලකිය යුතුය. ඒ අනුව ලංකා බැංකු ආඥා පනත යටතේ ඔවුන් විසින් කරන ලද යම් දෙයක් හෝ ක්‍රියාවක් මේ පනතේ වෙනත් ලෙස විශේෂයෙන් ඉඩ සලසා නොමැති නම් රජය බැංකුවේ එකම පූර්ව කොටස්කාරයා වීමේ හේතුවෙන් පමණක් නිෂ්ප්‍රභා හෝ අවලංගු නොවිය යුතුව තිබුනාසේ, නොවිය යුතුසේ සැලකිය යුතුය.

8. පහත දැක්වෙන විධිවිධාන බැංකුව පිළිබඳව ක්‍රියාත්මක විය යුතුය.

(අ) මෙම පනත පටන් ගැනීමට එක්බිතිවම පෙරාතුවූ දිනයේ සිටි බැංකුවේ අධ්‍යක්ෂවරු එම දිනයෙහි එවැනි අධ්‍යක්ෂ තනතුරු දැරීමෙන් වෙන් විය යුතුය.

(ආ) බැංකුවේ ගනු දෙනු හා කටයුතු පිළිබඳව කළමනාකාරත්වය, හා පාලනය මෙම වගන්තියේ සලසා ඇති පරිදි සකස්වූ අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි පැවරිය යුතුය.

(ඇ) එසේ සකස් වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ගනු දෙනු කර ගෙන යාම හෝ කටයුතු පාලනය සඳහා බැංකුවේ කාර්යයන් හා යුතුකම් හා බලතල දරනු හා ඉටු කැරෙනු ඇත

(ඈ) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ වරු 6 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. එයින් 5 දෙනෙකු ඇමතිවරයා විසින් පත්කළ යුතුය. අනෙකුත් අධ්‍යක්ෂ වරයා එවකට භාණ්ඩාගාරයේ ලේකම් ධූරය උසුලන්නා විය යුතුය. එසේ පත්කරන එක් එක් අධ්‍යක්ෂ වරයා මේ පනතෙහි "පත් කළ අධ්‍යක්ෂ වරයා" ලෙස හැඳින්වේ. භාණ්ඩාගාරයේ ලේකම් වරයා මේ වගන්තියෙහි "නිල අධ්‍යක්ෂ" ලෙස හැඳින්වේ.

(ඉ) උත්තර මන්ත්‍රී වරයෙකු හෝ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී වරයෙකු අධ්‍යක්ෂවරයෙකු වීමට සුදුසු නොවිය යුතුය.

(ඊ) ඇමතිවරයා විසින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙස, පත්කළ අධ්‍යක්ෂ වරුන්ගෙන් කෙනෙකු පත්කළ යුතුය.

(උ) සෑම පත්කළ අධ්‍යක්ෂ වරයෙකුම අවුරුදු 3 ක කාලයක් නිල දැරිය යුතුය. එසේ නොවිය යුත්තේ ඔහු ඊට කලින් නිලයෙන් පහ කළ හොත් හෝ තනතුරෙන් අස්වූවොත් පමණකි.

(ඌ) අසනීප නිසාවෙන් හෝ ලංකාවේ නොසිටීම නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ පත්කළ අධ්‍යක්ෂ වරයෙකුට තාවකාලික වශයෙන් ඔහුගේ තනතුරෙහි කටයුතු කිරීමට නොහැකි නම් ඔහු වෙනුවට අධ්‍යක්ෂ වරයෙකු ලෙස වැඩ බැලීම සඳහා වෙනත් කෙනෙකු ඇමතිවරයා විසින් පත්කළ යුතුය.

( එ ) නිල අධ්‍යක්ෂට, අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණීමට නොහැකි නම් ඔහුට ඔහු වෙනුවෙන් එම රැස්වීමට පැමිණීමට වෙනත් නිල ධාරියෙකුට බලය දිය හැකිය එසේ බලය දෙනු ලැබූ නිලධාරියා එවැනි රැස්වීමක අභිමතාර්ථයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සැලකිය යුතුය.

( ඒ ) ඇමතිවරයා වෙත ලිපියක් යැවීමෙන් පත්කළ අධ්‍යක්ෂ වරයෙකුට තම තනතුරෙන් අස්විය හැකිය.

( ඔ ) ඇමතිවරයා විසින් සුදුසු යැයි සිතන්නේ නම් ඔහුට පත්කළ අධ්‍යක්ෂ වරයෙකු තනතුරෙන් පහකළ හැකිය.

( ඕ ) අස්වීම නිසා හෝ කල් ඉක්මවීම නිසා හෝ තනතුරෙන් අස්වන අධ්‍යක්ෂවරයෙකු නැවත පත් කිරීම සඳහා සුදුසු වේ.

(ක) ඇමතිවරයා විසින් තීරණය කරණ ප්‍රමාණයන් අනුව හා තීරණය කරන පරිදි බැංකුවේ අරමුදල් වලින් අධ්‍යක්ෂ වරයෙකුට ඔහුගේ පාරිශ්‍රමිකය ගෙවිය හැකිය.

( ඛ ) නිල අධ්‍යක්ෂ වරයාට පත්කළ අධ්‍යක්ෂ වරුන්ට ඇති සියළුම අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබිය යුතුය.

9. අදාල දිනයෙන් පටන් ගෙන මෙම පනත පටන් ගැනීමට එක්බිතිවම පෙරාතුව දිනයෙන් අවසන් වන කාලය තුළදී, ලංකා බැංකු ආඥා පනතේ අභිමතාර්ථයන් සඳහා රජයේ අධ්‍යක්ෂ, බැංකුවේ අධ්‍යක්ෂ වරුන්ගේ රැස්වීමේදී ඡන්දය දීමට හිමිකම් ඇතිව සිටියා සේ සැලකිය යුතුය.

10. රජය අසහාය කොටස් කරුවා වශයෙන් ඇතිව ලංකා බැංකු ආඥා පනත යටතේ සමායතනයක් ලෙස බැංකුව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලුම විධිවිධාන සකස් කිරීම සඳහා මෙම පනත යටතේ නියෝග පැන විය හැකිය. එහෙත් විශේෂයෙන් මෙම නියෝග වලින් මෙම වගන්තියේ පළමුවෙන් සඳහන් කළ විධිවිධානයන් හි සාමාන්‍යතාවයට හානියක් නොවිය යුතුය එම අභිමතාර්ථ ඉටු කිරීම සඳහා මෙම පනතේ මෙම කොටසේ කලින්වූ විධිවිධාන වලට ඇතුළත් ප්‍රතිපත්ති හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට හෝ කරගෙන යාමට හෝ ලංකා බැංකු ආඥා පනතට අවශ්‍ය සියලුම සංශෝධන හෝ වෙනස් කිරීම් එම නියෝගවලින් කළ හැකිය.

11. ලංකා බැංකු ආඥා පනතේ හෝ එය යටතේ සකස් කරන ලද යම් රෙගුලාසියක් යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ පටහැනිව කුමක් තිබුණද මෙම පනතේ මෙම කොටසේ විධිවිධාන හෝ ඒවා යටතේ සකස් කරන රෙගුලාසි ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව රජය බැංකුවේ අසහාය කොටස් කරු වීමෙන් ආඥා පනත යටතේ බැංකුව සමායතනයක් ව තිබීම අවසන් නොවූවා සේ සැලකිය යුතුය.

12. මෙම පනතේ මෙම කොටසේ "ලංකා බැංකු ආඥා පනත" යනුවෙන් අදහස් කෙරෙනුයේ පසුව සංශෝධිත පරිදි වූ 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනතයි.

## 2 වැනි කොටස.

ආදායම් බදු කෙරෙහි අධිභාරය ආදායම් බදු ආඥා පනතට සංශෝධන, ඉඩම් බදු පනත හා පුද්ගල බදුපනත, අධිබද්දක් පැනවීම හා අය කිරීම, අතිරික්ත ආදායම සුදුසු පරිදි යෙදවීම.

**13.** (1) 1961 අප්‍රේල් 1 වැනිදාසිට පටන් ගැනෙන තක්සේරු වර්ෂය තුළ ආදායම් බදු ගෙවිය යුතු සෑම අයෙකුම, වෙනත් කුමන ලිඛිත නීතියක හෝ චාරිත්‍රයක හෝ ප්‍රදානයක හෝ ගිවිසුමක හෝ පටහැනිව කුමක් තිබුණද එම තක්සේරු වර්ෂය සඳහා ගෙවියයුතු ආදායම් බදු ප්‍රමාණයෙන් 15% කට සමාන අධිභාරයක් ගෙවීමට යටත් විය යුතුය.

(2) අනේවාසික වෙළෙඳ සමාගමක් සම්බන්ධයෙන් නම්, පළමුවෙනි උප වගන්තිය සඳහා අධිභාරය ගණන් ගත යුත්තේ, 1961 අප්‍රේල් 1 වෙනිදාසිට පටන් ගැණෙන තක්සේරු වර්ෂයෙහි, එම තක්සේරු වර්ෂයෙහි බදුඅය කළ හැකි ආදායමෙන් ආදායම් බදු ආඥා පනතේ 53 (ඇ)වගන්තියෙහි විධිවිධාන අනුව ආදායම් බද්දේ කොටසක් විය යුතු බදු අය කළ හැකි ආදායමෙන් 6%ක්, ආදායම් බදු ප්‍රමාණයට ඇතුලත් නොකර තිබේ නම්, එම වෙළඳ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය අනුවය.

(3) ආදායම් බදු ආඥා පනතේ 44 වන වගන්තියෙහි 3 වන උප වගන්තිය හෝ, 53 (ඇ) වගන්තියෙහි 6 වෙනි උප වගන්තිය හෝ, 7 වෙනි උප වගන්තිය හෝ, 8 වෙනි උප වගන්තිය හෝ යටතේ බදු හිලව් කිරීමට හිමිකම් ඇති යම් අයෙකු පිළිබඳව, පළමුවැනි උප වගන්තියෙහි සඳහන් කර ඇති අධිභාරය ගණන් ගත යුත්තේ එම හිලව් කිරීම නොකර ඇත්නම් එකී අය විසින් 1961 අප්‍රේල් 1 වැනිදාසිට පටන් ගැණෙන තක්සේරු වර්ෂය තුළ ගෙවිය යුතු ආදායම් බද්ද අනුවය.

(4) 1 වැනි උප වගන්තියේ සඳහන් කර ඇති අධිභාරය තක්සේරු කිරීම, ගෙවීම හෝ අයකර ගැනීම සඳහා, 1961 අප්‍රේල් 1 වෙනිදාසිට පටන් ගැනෙන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද ලෙස මෙම අධිභාරය සැලකීමෙන් එය කෙරෙහි ආදායම් බදු ආඥා පනතේ 10 වැනි පරිච්ඡේදය 11 වැනි පරිච්ඡේදය 12 වැනි පරිච්ඡේදය සහ 13 වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන බලපැවැත්විය යුතුය.

(5) 1961 අප්‍රේල් 1 වැනිදාසිට පටන් ගැනෙන තක්සේරු වර්ෂය සඳහා නියමිත පරිදි අයවිය යුතු ප්‍රමාණයට වඩා අධිකව ආදායම් බදු ගෙවීමේ හේතුවෙන් යම්කිසි පුද්ගලයෙකුට ආදායම් බදු ආඥා පනතේ 84 වැනි වගන්තිය යටතේ මුදල් ආපසු ගෙවීමට ඇත්නම්, එවැනි පුද්ගලයෙකු විසින් උප වගන්තියේ සඳහන් කර ඇති අධිභාරය ගෙවා ඇත්නම්, ඔහුට එම 84 වැනි වගන්තිය යටතේ ආපසු ගෙවිය යුතු මුදලෙන් 15%ක් ආපසු ලබා ගැනීමට හැකිවියයුතුය.

**14.** 1961 අප්‍රේල් 1 වැනිදා හෝ ඉන් පසුව පටන් ගැණෙන එක් එක් තක්සේරු වර්ෂය පිළිබඳව ආදායම් බදු ආඥාපනතේ 20 (ඊ) වගන්තිය (1959 අංක 13 දරන පනතින් සංශෝධිත පරිදි) එම වගන්තියේ 2 වැනි හා 4 වැනි උප වගන්ති වල තිබෙන "රුපියල් දහස" යන ප්‍රමාණය වෙනුවට "රු 500" යන ප්‍රකාශය හා එම වගන්තියේ 4 වැනි උප වගන්තියේ යෙදෙන "රු. 2000" යන ප්‍රකාශය වෙනුවට "රු. 3000" යන ප්‍රකාශය ආදේශ වූවාක් සේ බල පැවැත්විය යුතුය.

**15.** 1961 අප්‍රේල් 1 වැනිදා හෝ ඉන් පසුව පටන් ගැණෙන කුමන තක්සේරු වර්ෂයක හෝ 1961 අංක: 27 දරන ඉඩම් බදු පනතේ 3 හා 4 වැනි වගන්ති බල නොපැවැත් විය යුතුය. නමුත් මින් පසු ඉඩ සලසා ඇති පරිදි හැරෙන්නට එබඳු කුමන තක්සේරු වර්ෂයක් සඳහා වූවද එම පනතේ අනිකුත් වගන්ති බල පැවැත්විය යුතුය.

**16**. 1961 අප්‍රේල් 1 වැනිදා හෝ ඉන් පසුව පටන් ගැණෙන එක් එක් තක්සේරු වර්ෂය තුළ දී, තක්සේරු වර්ෂයට පෙරාතුව වර්ෂයේ අවසන් දිනයේදී අක්කර 20 කට අඩු නොවන මුළු ප්‍රමාණයක කුමන ඉඩමක හෝ අයිතිකරුවන හැම පුද්ගලයෙකුගෙන්ම පහත දක්වෙන ප්‍රමාණ අනුව 1961 අංක: 24 දරන ඉඩම් බදු පනතන යටතේ ඉඩම් බදු අයකරගත යුතුය

| | |
|---|---|
| ඉඩමෙහි මුළු ප්‍රමාණය අක්කර 20 ට නොඅඩු හා අක්කර 50 කට නොවැඩි වේ නම්:- | එම ඉඩමේ මුළු ප්‍රමාණයට එක් අක්-කරයට රුපියල් 5 බැගින්. |
| ඉඩමේ මුළු ප්‍රමාණය අක්කර 50 කට නොඅඩු හා අක්කර 100 කට නොවැඩි නම්:- | එම ඉඩමේ මුළු ප්‍රමාණයට එක් අක්කර-යට රුපියල් 10 බැගින්. |
| ඉඩමේ මුළු ප්‍රමාණය අක්කර 100 ක් හෝ ඊට වැඩි නම්:- | එම ඉඩමේ මුළු ප්‍රමාණයට එක් අක්කරයකට රුපියල් 15 බැගින් |

**17**. 1961 අප්‍රේල් 1 වෙනිදා හෝ ඉන් පසුව පටන් ගැණෙන එක් එක් තක්සේරු වර්ෂය පිළිබඳව

(අ) 1959 අංක: 14 දරන පුද්ගල බදු පනතෙහි 7 වැනි වගන්තිය, එහි "එවැනි කොටස" යන වචන වල සිට "වටිනාකම රුපියල් වලින්" යන වචන දක්වා ඇති සියලුම වචන වෙනුවට, "පවුලේ ප්‍රධානියාගේ" ශුඩ ධනය එම තක්සේරු වර්ෂය සඳහා රුපියල් දෙලක්ෂයක් හෝ ඊට වැඩි වේ නම්, එවැනි ශුඩ ධනය" යන වචන ආදේශ වූවාක් සේ බල පැවැත්විය යුතුය. සහ,

(ආ) එම පනතේ 8 වැනි වගන්තිය "එවැනි කොටස" යන වචනයේ සිට "වටිනාකම රුපියල් වලින්" යන සියළුම වචන වෙනුවට "පවුලකට අයත් නොවූ යම් පුද්ගලයෙකුගේ, තක්සේරු වර්ෂයක ශුඩ ධනය රුපියල් දෙලක්ෂයක් හෝ ඊට වැඩි නම් එවැනි ධනය" යන වචන ආදේශ වූවාක් සේ බල පැවැත්විය යුතුය.

**18**. (1) මෙම පනතේ 2 වන උප ලේඛනයේ පළමුවැනි තීරයේ නියමිත සෑම පුද්ගලයෙකුගෙන්ම (මෙයින් පසු මෙම කොටස බලපැවැත්වෙන පුද්ගලයා ලෙස සඳහන් කැරෙන) 1962 අප්‍රේල් 1 වැනිදා හෝ ඉන් පසු පටන් ගැණෙන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම, එම උප ලේඛනයේ 2 වන තීරයේ ප්‍රතිරූප සටහනින් නියමිතව ඇති ශුඩ ආදායමට වැඩිවන ප්‍රමාණයෙන් 50% ක් බදු වශයෙන් (මෙයින් මතු "අධි බද්ද" වශයෙන් සඳහන් කැරෙන) අය කළ යුතුය.

(2) මෙම කොටස බල පැවැත්වෙන සෑම පුද්ගලයෙක්ම, අධි බද්ද ගෙවීමෙන් අනතුරුව පළමුවැනි උප වගන්තියේ සඳහන් කර ඇති ශෙෂය, එවැනි ශෙෂය ගෙවිය යුතුයයි කොමසාරිස්වරයා විසින් ඉල්ලා එවන ලද දැන්වීමේ දිනයේ සිට 30 දිනක් ඇතුළත දී කොමසාරිස්වරයාට ගෙවිය යුතුය. එවැනි ශෙෂය වශයෙන් කොමසාරිස්වරයාට ගෙවන මුදල ඔහු විසින් ඒ සඳහා පිහිටුවා ඇති ජාතික සංවර්ධන අරමුදලට බැර කළ යුතුය.

එසේ වුවද, මෙම උප වගන්තියේ ඉහත සඳහන් විධිවිධානයන්හි සඳහන් මුදල් ශේෂය හෝ එයින් කොටසක් යම්කිසි පුද්ගලයෙකු විසින් ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යාපාරයක ආයෝජනයක් වශයෙන් මේ කොටසේ පසුව එන විධිවිධාන යටතේ ගැණෙන වියදම් ශීර්ෂයන්හි යොදා තිබේ යයි කොමසාරිස්වරයාට ඒත්තු ගැන්වෙන පරිදි ඔප්පු කළේ නම් ඔහු විසින් එවැනි ශෙෂය හෝ එයින් කොටස කොමසාරිස් වරයාට ගෙවිය යුතු නොවේ.

**19**. (1) වැනි වගන්තියේ 2 වන උප වගන්තිය යටතේ යම්කිසි පුද්ගලයෙකු විසින් ගෙවන ලද මුදල්, කොමසාරිස්වරයාට ලැබුණ වහාම කොමසාරිස්වරයා විසින් එම ගෙවුම් පිළිබඳව භාණ්ඩාගාරයේ ලේකම් වරයාට දැන්විය යුතුය. එවිට භාණ්ඩාගාරයේ ලේකම් වරයා විසින් එම පුද්ගලයාට 5% ක පොළී සහිත ජාතික සංවර්ධන ඇපකර නිකුත් කළ යුතුය. ඇමතිවරයා විසින් අනුමත කොට ගැසට් නිවේදනයකින් දන්වනු ලැබූ ව්‍යාපාරයක ආයෝජනය කිරීම සඳහා මිස වෙනත් ලෙසක ඇපකර දරන්නා විසින් එම ඇපකර ගනුදෙනු නොකළ යුතුය.

එසේ වුවද එම ඇපකර ලංකාවේ රට වැසියෙකු නොවන අයෙකු විසින් දරන්නේ නම්, ඔහු එහි වටිනාකම එවකට බල පැවැත්වෙන විනිමය පාලන ව්‍යවස්ථා අනුව පිටරට යැවීමට බලය ලත් බව ඇමතිවරයාට ඒත්තු ගන්වන්නේ නම්, ඔහුට එවැනි ඇපකර ගනුදෙනු කළ හැකිය.

මෙම වගන්තිය යටතේ නිකුත් කරන ඇපකර සම්බන්ධයෙන් යම්කිසි පුද්ගලයෙකු ලබන පොළී, ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

(2) පළමුවන උප වගන්තියේ අභිමතාර්ථයන් සඳහා පහත දැක්වෙන එක් එක් වියදම් ශීර්ෂයන් ඇමතිවරයා විසින් අනුමත කළ ව්‍යාපාරයක ආයෝජනයන් ලෙස සැලකිය යුතුය.

(අ) අදාළ දිනයට පෙරාතුව කුමන දිනයක හෝ මෙම පනතට බල පැවැත්වෙන පුද්ගලයෙකු විසින් දරන ලද පහත දැක්වෙන වියදම් ශීර්ෂයෙන්

  i නිශ්චල දේපල අයත් කර ගැනීමේ, ගොඩනැංවීමේ හා පුළුල් කිරීමේ වියදම්,

  ii. සියළුම ආයෝජන වියදම්;

  iii ජීවිත, අනතුරු සහ සෞඛ්‍යරක්ෂණ වාර මුදල් සහ වාර්ෂිකයන් මිලදී ගැනීමේ වාර මුදල්;

  iv. ආයෝජනය කොට ඇති යම් මුදලක් සඳහා ගත් ණය ආපසු ගෙවීමේදී දරන ලද වියදම්;

(ආ) එක් පදිංචි නිවාසයක් සඳහා හෝ නිශ්චල දේපලක් සඳහා කරන ලද ආයෝජන හෝ,

(ඇ) ජීවිත රක්ෂණ ඔප්පු පිළිබඳව ගෙවන ලද යම් වාර මුදලක්.

**20**. 18 (ඇ) වන වගන්තියේ 2 වන උප වගන්තිය යටතේ කොමසාරිස් වරයා විසින් ඉල්ලූවිට ගෙවීමට නියමිත හෝ අධි බද්ද වශයෙන් ලබාගැනීමට නියමිත යම් මුදලක් ගෙවීම සඳහා ඉඩ සැලසීමට රෙගුලාසි පැනවිය හැකිය. එසේ පනවන රෙගුලාසි වලින් එවැනි මුදල් ලඝු පරිදි ආපසු ලබා ගැනීමට ඉඩ සැලසිය හැකිය.

**21**. මෙම පණතේ මේ කොටසෙන් "පුද්ගලයා" යන්න

(අ) මෙම පනතේ 18 වන වගන්තිය සම්බන්ධයෙන් අදහස් කරනුයේ ආදායම් බදු ආඥා පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් නොවූ පුද්ගලයෙකි. සහ

(ආ) ආදායම් බදු ආඥා පනතේ 20 (ඇ) වගන්තිය යටතේ යම් පවුලක් සම්බන්ධයෙන් අදහස් කරනුයේ එම පවුලේ ප්‍රධානියාය.

"ආදායම් බද්ද" යනුවෙන් අදහස් කරනුයේ ආදායම් බදු ආඥා පනත යටතේ අය කරන බද්දය.

යම් පුද්ගලයෙකු සම්බන්ධයෙන් "ශුඩ ආදායම" යනුවෙන් අදහස් කරනුයේ 1962 අප්‍රේල් 1 වැනිදා හෝ ඉන් පසුව පටන් ගැණෙන කුමන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් හෝ තක්සේරු කළහැකි ආදායමෙන් පහත දැක්-වෙන ශීර්ෂ අඩු කොට ලැබෙන ශෙෂයවේ.

ආදායම් බදු පනතේ විධිවිධාන අනුව එම තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ගුණනය කරන ලද ආදායම් බද්ද (අධිභාරයද ඇතුළුව)

ඊට පෙරාතුතක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වූ (ඔහුගේ බදු අයකළහැකි ආදායමෙන් පුද්ගල බද්දට දෙන දායක දීමනා ඇතුළත් නොවූ) පුද්ගල බද්ද

පෙරාතු තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඉඩම් බද්ද

විශ්‍රාම පාරිතෝෂික දීමනා

කුමන අර්ථසාධක අරමුදලකින් හෝ ලැබෙන ප්‍රතිලාභ.

පරිවර්තිත විශ්‍රාම වැටුප්,

වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල්ආඥා පනතේ 38 (1) වැනි වගන්තිය යටතේ හෝ 39 වැනි වගන්තිය යටතේ ආපසු ගෙවීම් හෝ පලාත් පාලන සේවාව සඳහා පිහිටුවන ලද වැන්දඹු අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාල කුමන රෙගුලාසියක් යටතේ හෝ ආපසු ගෙවීම්.

අතේවාසිකයින්ට පිට රටින් ලැබෙන ආදායම.

ආදායම් බදු ආඥා පනතේ 2 ආ වගන්තියේ එන යම්කිසි සහනයක් බලපැවැත්වෙන්නේ නම්, එම විධිවිධාන බලනොපැවැත්වූයේ නම් ගෙවීමට සිදුවන බදු ප්‍රමාණය,

එසේ වුවද ශුඩ ආදායම තීරණය කිරීමේදී බදු ගෙවන්නාට තමාගේ මතාපය පරිදි සියල්ල එක් කොට සලකන අගය ක්ෂයවීම වෙනුවට කරන අඩු කර ගැනීම වෙනුවට එම අගය ක්ෂය වීම තීරණය කැරෙන සියල්ල එක්කොට සලකන ප්‍රාග් ධනයෙහි වාර්ෂික කොටසක් නියම කළ හැකිය. එහෙත් එම වාර්ෂික කොටස ගුණනයකළ යුත්තේ කොමසාරිස්වරයාගේ කැමැත්ත අනුවය.

එසේ වුවද, නව දූරටත් ශුඩ ආදායම තීරණය කිරීම සඳහාපහත දැක්වෙන ශීර්ෂ අඩු කර ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

මෙහි සඳහන් කර ඇති කුමන වර්ගයක හෝ හිඟ බදු.

වරිපණම්,

"අතේවාසික සමාගම" යන්න එම ආඥා පනතෙහි එම තේරුමම දැරිය යුතුය.

"තක්සේරු වර්ෂය" යන්න එම ආඥා පනතේ තේරුමම දැරිය යුතුය.

**3 වැනි කොටස.**

## බැංකුවල ගිණුම් ඇරඹීම

**22**. (1) අදාළ දින සහ ඊට පසුව

( අ ) ලංකාවේ පුරවැසියෙකු වන කිසිම පුද්ගලයෙක්

(ආ) ලංකාවේ පුරවැසියෙකු, අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් ඇති කිසිම බලයලත් සංස්ථාවක්;

(ඇ) ලංකාවේ පුරවැසියෙකු, හවුල් කරුවකු වශයෙන් ඇති කිසිම වෙළෙඳ සමාගමක්;

(ඈ) ලංකාවේ පුරවැසියන් එක්කෙනෙකු හෝ වැඩි දෙනෙකු විසින් කටයුතු පාලනය කරන කුමන නමකින් හෝ හැඳින්වෙන කිසිම වෙනත් පුද්ගල මණ්ඩලයක්;

මහජන බැංකුව, ලංකා බැංකුව, ලංකා සේවිංස් බැංකුව, ලංකා තැපැල් කන්තෝරු සේවිංස් බැංකුව හෝ සමූපකාර සමිති ආඥා පනත යටතේ සමිතියක් වශයෙන් ලියා පදිංචි කළ කුමන බැංකුවක හෝ හැරෙන්නට ගිණුම් නො ඇරඹිය යුතුය.

එසේ වුවද (අ) ඡේදයෙහි හෝ, (ආ) ඡේදයෙහි හෝ, (ඇ) ඡේදයෙහි හෝ, (ඈ) ඡේදයෙහි හෝ සඳහන් කළ කුමන පුද්ගලයෙකු හෝ මෙම උප වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන පහත දැක්වෙන කරුණු නිසාවෙන් පමණක් උල්ලංඝනය කළාසේ නොසැලකිය යුතුය.

(අ) අදාළ දිනයෙහි මහජන බැංකුව හෝ ලංකා බැංකුව (මෙහි සහ මින් පසුව එන විධිවිධානයන්හි "විදේශීය බැංකුව" නමින් හැඳින්වෙන) හැර වෙනත් කුමන බැංකුවක හෝ ඔහුට ජංගම ගිණුමක් තිබූ විටෙක, ඔහු ණයක් හෝ අයිරා ගිණුමක් එවැනි විදේශීය බැංකුවක අරඹන්නේ නම් හෝ

(ආ) අදාළ දිනයෙහි කුමන විදේශීය බැංකුවක හෝ ඔහු විසින් දරන ලද ස්ථාවර තැන්පතුවක් කල් පිරුණ විට, එම තැන්පතුව අදාළ දිනයට පසුව ඔහු විසින් අළුත්වැඩියා කරන්නේ නම් හෝ

(ඇ) අදාළ දිනයෙහි හෝ ඉන්පසුව කුමන අවස්ථාවක හෝ, ඔහු විසින් විදේශීය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක, යම් මුදලක් තැන්පත් කරනවිට, එම මුදල තැන්පත් කරන දිනයෙහි, ඔහුගේ නමින් බැංකුව දරන ස්ථාවර ගිණුමෙහි අතිකුත් මුදල්ද, එම මුදලද එකතුවූ විට එසේ එකතුවූ මුදල, අදාළ දිනයෙහි එම බැංකුවෙහි ඔහුගේ ස්ථාවර ගිණුමෙහි තිබූ සියලුම මුදල්වලට වැඩි නොවන්නේ නම්,

තව දුරටත් කුමන විදේශීය බැංකුවක හෝ සේවකයෙකු වන ලංකාවේ පුරවැසියෙක් ඔහු එසේ සේවයේ යෙදී සිටියදී ජංගම හෝ ඉතිරිකිරීමේ හෝ ස්ථාවර ගිණුමක් එම බැංකුවෙහි අරඹන්නේ නම් එම කරුණ නිසාවෙන් මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන උල්ලංඝනය කළාසේ නොසැලකිය යුතුය.

(2) (අ) ඡේදයෙහි, (ආ) ඡේදයෙහි, (ඇ) ඡේදයෙහි හා (ඈ) ඡේදයෙහි සඳහන් මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ, අදාල දිනයෙහි ගිණුමක් තිබෙන පුද්ගලයින්ට, හෝ මහජන බැංකුව, ලංකා බැංකුව, හැරෙන්නට වෙනත් වෙළඳ බැංකුවක, ඉල්ලූවිට මුදල් ලබාගත නොහැකි (ස්ථාවර තැන්පතු ගිණුමක් නොවන) ඉතිරි කිරීම් ගිණුමක හෝ තැන්පතු ගිණුමක ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීමට 1 වන උප වගන්තියේ කිසි විධිවිධානයකින් අවසර දුන්නා සේ නොසැලකිය යුතුය. මෙම උප වගන්තියෙහි "වෙළඳ බැංකු" යන ප්‍රකාශයෙහි තේරුම 1949 අංක: 58 දරන මුදල් නීති පණතේ 126 වැනි වගන්තියෙහි ඇති තේරුමම විය යුතුය.

**23.** මෙම පනතේ මෙම කොටසේ පරමාර්ථයන් සඳහා අවශ්‍ය වන තොරතුරු සැපයීමට, කුමණ බැංකුවක හෝ කළමනාකරුවකුට ලියා දැන්වීමට නියම බලධාරියාට හැකිය. එවිට කළමනාකරු විසින් එවැනි දැන්වීමකින් කළ ඉල්ලීම ඉටු කළයුතුවා මෙන්ම එම තොරතුරු, දැන්වීමෙහි නියම කෙරෙන කාලය තුළදී ද සැපයිය යුතුය.

## 8 වැනි කොටස

## සාමාන්‍ය

**57.** මෙම පනතේ පරමාර්ථයන් සඳහා අවශ්‍ය වන පරිදි නියම බලධාරීන් වශයෙන් හෝ, නියම බලධාරීන් වශයෙන් වැඩ බැලීමට, නම් වශයෙන් හෝ නිලවශයෙන් යම් පුද්ගලයන් ගණනක් පත්කළ හැකිය. එසේ පත් කරන පුද්ගලයන් ලංකාව තුලම හෝ එහි සීමිත ප්‍රදේශයක හෝ මෙම සම්පූර්ණ පනත සඳහා හෝ එහි විශේෂ කොටසක් සඳහා හෝ පත්කළ හැකිය. ඒ අනුව "සුදුසු නියම බලධාරියා" යන ප්‍රකාශය මෙම පනතේ කොතැනක යෙදුනද ඒ අනුව සකස් විය යුතුය.

**58.** යම්කිසි නියම බලධාරියෙකුට හෝ එවැනි බලධාරියෙකු විසින් බලය දෙනු ලැබූ යම් පුද්ගලයෙකුට හෝ, මෙම පනත යටතේ ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයදුම් කරුවකුට, එවැනි ලියා පදිංචි කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමට විධාන කළහැකිය. එවිට අයදුම් කරු විසින් එම විධානය ඉටු කළ යුතුය.

**59**. මෙම පනතේ කලින් සඳහන් කළ විධිවිධාන වල කෙසේ තිබුනද, යම්කිසි පුද්ගලයෙකුගේ මාසික පඩි නඩි සහ ඔහුගේ සේවාවෙන්, වෘත්තියෙන් සහ ව්‍යාපාරයෙන් හෝ සේවාවෙන් සහ ව්‍යාපාරයෙන් හෝ සේවාවෙන් සහ වෘත්තියෙන් හෝ වෘත්තියෙන් සහ ව්‍යාපාරයෙන් ලැබෙන මුළු ආදායම රු. 3600 කට වැඩි වේ නම්, ඔහු ජාතික සංවර්ධන බද්ද වශයෙන් කොමසාරිස් වරයාට එම මාසික පඩි නඩි වලින් හා ආදායමෙන් 4% කට සමාන ප්‍රමාණයක් ගෙවීමට යටත් විය යුතුය. එසේ වුවද, එවැනි පුද්ගලයෙකු මෙම පනතේ වෙනත් කුමන විධිවිධානයක් යටතේ හෝ ජාතික සංවර්ධන බද්ද ගෙවීමට යටත් නොවේ. එවැනි බදු ගෙවීම් හෝ අයකර ගැනීම පිළිබඳ මෙම පනතේ එයට අදාළ විධිවිධානයන් වෙනස් කිරීම සඳහා නියෝග සකස් කළහැකිය.

**60** (1) මෙම පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සහ පවත්වාගෙන යාම සඳහා නියෝග සකස් කිරීමට ඇමතිවරයාට හැකිය.

(2) පළමුවැනි උප වගන්තියෙන් පවරා ඇති බලතල වල සාමාන්‍යතාවට හානියක් නොවන පරිද්දෙන් පහත දැක්වෙන කරුණු පිළිබඳව විශේෂයෙන් නියෝග සකස් කිරීමට ඇමතිවරයාට හැකිය.

(අ) නියම කිරීමට අවශ්‍ය යම්කිසි කරුණක් හෝ මෙම පනතේ නියෝග සකස් කිරීමට බලය දී ඇති යම් කරුණක්;

(ආ) අධිබද්ද හා ජාතික සංවර්ධන බද්ද පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීම,

(ඇ) ජාතික සංවර්ධන සහ අධි බද්ද තක්සේරු කිරීම හා අය කරගැනීමේ ආකාරය සඳහා ඉඩ සැලසීම.

(ඈ) ජාතික සංවර්ධන බද්ද සහ අධි බද්ද අය කිරීම් පිළිබඳව අභියාචන සහ එවැනි අභියාචන කිරීමේ පිළිවෙළ සහ එවැනි අභියාචන කුමන කොන්දේසි වලට යටත්විය යුතුද යන්න.

(ඉ) ජාතික සංවර්ධන බද්දට යටත් සේව්‍යයන්ගෙන් හෝ අනිකුත් අයගෙන් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් එම අයකර ගැනීම් කරගත නොහැකි අවස්ථාවලදී ඒවා අයකරගතයුතු අන්දම තීරණය කිරීම;

(ඊ) අධිබද්ද සහ ජාතික සංවර්ධන බද්ද පිළිබඳව අතිරේක තක්සේරු කිරීම්;

(උ) යම්කිසි අයෙකු හෝ යම්කිසි පුද්ගලයෙකු විසින් අතිරික්තව ගෙවන ලද අධි බද්ද හෝ සංවර්ධන බද්ද ආපසු ගෙවීම;

(ඌ) ජාතික සංවර්ධන බද්ද හෝ අධි බද්ද හෝ පැනවීම හෝ අයකර ගැනීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් නිල රහස්‍යතාව පවත්වාගෙන යාම;

(3) ඇමතිවරයා විසින් සකස් කරන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකළ යුතුය. එම නියෝග එවැනි පළ කරන දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් නියමිත පසු දිනක හෝ සිට වලංගු විය යුතුය.

(4) ඇමතිවරයා විසින් සකස් කරන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිඉක්මනින් උත්තර මන්ත්‍රී මණ්ඩලය හමුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය එසේ අනුමත නොකළ කුමන නියෝගයක් හෝ එම අනුමත නොකළ දිනයේ සිට අවලංගු වූවා සේ සැලකිය යුතුය. නමුත් එය යටතේ, කලින් කළ, කිසිවකට එයින් හානියක් නොවිය යුතුය.

**61**. මෙම පනතේ යම්කිසි විධිවිධානයක් හෝ එය යටතේ සකස් කරන ලද නියෝගයක් උල්ලංඝනය කරන හෝ ඉටු කිරීමට අපොහොසත් වන පුද්ගලයෙක් වරදක් සම්බන්ධයෙන් වරදකරු විය යුතුය. ඔහු මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු වශයෙන් නඩු විභාග කොට වරදකරු කරනු ලැබූ පසු රු. 1000 කට නොවැඩි වන දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි වන කාලයක දෙවර්ගයෙන් කුමන වර්ගයක හෝ සිර දඬුවමකට හෝ දඩය හා සිර දඬුවම යන දෙකටම හෝ යටත් විය යුතුය.

**62**. මෙම පනත යටතේ යහපත් චේතනාවෙන් කොමසාරිස්වරයා හෝ නියමිත බලධාරියා හෝ කොමසාරිස් වරයාගේ විධානය හෝ එම විධානය හෝ යටතේ යම්කිසි නිලධාරියෙකු විසින් කරනු ලබන හෝ කරනු ලැබුවේ යයි සලකන ක්‍රියාවක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් හෝ නඩුවක් නොවිය යුතුය.

**63** මෙම පනතේ පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අදහස් නොවේ නම් හැර, —

මෙම පනතේ කුමන විධිවිධානයක් සම්බන්ධයෙන් හෝ "නියමිත දිනය" යන ප්‍රකාශය යෙදේ නම්, එයින් අදහස් කරනුයේ එම විධිවිධානයේ පරමාර්ථයන් සඳහා ඇමතිවරයා විසින් නියම කරනු ලබන දිනයයි.

"ව්‍යාපාරය" යන්නට වෙළඳාම ඇතුළත් වෙයි. නමුත් එයට වෘත්තියක් හෝ කුමන කෘෂිකාර්මික ව්‍යාපාරයක් හෝ එම කෘෂිකාර්මික ව්‍යාපාරයෙන් නිෂ්පාදිත දෙයින් භාණ්ඩ හෝ ද්‍රව්‍ය සෑදීම ඇතුළත් නොවේ.

"කොමසාරිස්වරයා" යනුවෙන් අදහස් කරනුයේ දේශීය ආදායම් බදු කොමසාරිස්වරයාය. එයට නියෝජ්‍ය දේශීය ආදායම් බදු කොමසාරිස්වරයා හෝ වැඩ බැලීමට සාමාන්‍ය වශයෙන් හෝ යම් විශේෂ කරුණක් සඳහා හෝ කොමසාරිස්වරයා විසින් තමා වෙනුවෙන් කටයුතු කිරීමට විශේෂයෙන්ම බලය දෙනු ලැබූ සහකාර දේශීය ආදායම් බදු කොමසාරිස් වරයෙකු හෝ ඇතුලත් වේ.

"අදාළ දිනය" යනුවෙන් අදහස් කරනුයේ 1961 ජූලි 27 වැනිදාය.

"භාණ්ඩාගාරයේ ලේකම් වරයා" යන්නට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයාද ඇතුලත් වේ.

"තක්සේරු" වර්ෂය යන්නෙහි තේරුම ආදායම් බදු ආඥා පනතෙහි එයට දී ඇති තේරුම ම විය යුතුය.

## (ආ) 1961 දී මුදල් මණ්ඩලය විසින් සකස් කරගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

චක්‍ර ලේඛ අංක 12

1961 ජනවාරි 26 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.

**අත්තිකාරම සඳහා මහ බැංකු පොලිය**

(මුදල් නීති පනතේ 82 සහ 86 වැනි වගන්ති සම්බන්ධවයි.)

1. අද පටන් (1961 ජනවාරි 26 වැනි දින) රජයේ සුරැකුම්පත් ඇප කොට වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ලබා ගන්නා ණය සඳහා පොලිය වර්ෂයකට සියයට 4 ක් විය යුතුය.

2. අද පටන් (1961 ජනවාරි 26 වැනි දින) නිෂ්පාදන ණය සඳහා වූ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇප කොට වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ලබා ගන්නා පොලිය වර්ෂයකට සියයට 4 ක් විය යුතුය.

3. 1960 අගෝස්තු 12 වැනි දින හා අංක 9 දරන චක්‍ර ලේඛය ද අගෝස්තු 27 වැනි දින හා අංක 9/1 දරන චක්‍ර ලේඛය ද මෙසින් ඉවත් කර ගනු ලැබේ.

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරි,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍ර ලේඛ අංක 18

1961 ජනවාරි 26 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.

## ණය සඳහා වෙළෙඳ බැංකු පොලිය

(මුදල් නීති පනතේ 103 වැනි වගන්තිය සම්බන්ධවයි)

1960 අගෝස්තු 12 වැනි දින හා අංක 10 දරන චක්‍ර ලේඛය ද, 1960 අගෝස්තු 27 වැනි දින හා අංක 10/1 දරන චක්‍ර ලේඛය, ද 1961 ජනවාරි 26 වැනිද වූ අද සිට මෙයින් ඉවත් කර ගනු ලැබේ.

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපතිරන
අධිපති.
ශ්‍රී ලංකා මහ බැංකුව.

වකු ලේඛ ලිපි අංක 14

1961 ජූලි 24 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ. 1.

මහත්මයාණනි,

**සංචිත අවශ්‍යතා – 'ඞී' සහ 'ජී' රෙගුලාසිය**

1950 අගෝස්තු 28 වැනි දින හා අංක 10,143 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, විටින් විට සංශෝධිත "ඞී" රෙගුලාසිය තැවත සංශොධනය කරමින් 1961 ජූලි 21 වැනි දින ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීම්වලට හා 1961 පෙබරවාරි 1 වැනි දින හා අංක 12,280 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 'ජී' රෙගුලාසියට ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. මෙම දැන්වීම්වල පිටපත් මේ සමග අමුණා ඇත.

2. ඔබගේ බැංකුව, "අවශ්‍ය සංචිත" ප්‍රමාණයෙන් කොටසක් එහි වත්කම් වශයෙන් ලංකාවේ නෝට්ටු හා කාසි වලින් ද, කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතු සවරූපයෙන් ද, පවත්වාගෙන යාමට තීරණය කරන්නේ නම්, තැවත දන්වන තුරු අවශ්‍ය සංචිතවලින් 50% කට නොවැඩි ප්‍රමාණයක් එහි මුදල් නෝට්ටු සහ කාසිවලින් ද, ශෙෂය මහ බැංකුවේ රුපියල් තැන්පතු වශයෙන් ද තබා ගත හැකිය. "මෙහි මුදල් නෝට්ටු හා කාසි" යනුවෙන් අදහස් කරනුයේ 1961 මාර්තු 15 වැනි දින ගණන් පියවන විට, ඔබගේ බැංකුව සතුව තුබූ නෝට්ටු හා කාසිවලට අමතරව එකතු වූ මුදල් නෝට්ටු හා කාසිය.

3. ඉහත සඳහන් ඡේදප්‍රකාර කවර දිනයක හෝ ඔබගේ බැංකුව අවශ්‍ය සංචිතවලින් කොටසක් මුදල් නෝට්ටු හා කාසි වශයෙන් තබා ඇති කල්හි, එදින ගණන් පියවන විට, 1961 මාර්තු 15 වැනි දින ගණන් පියවන ලද අවස්ථාවේදී එහි තිබූ මුදල් නෝට්ටු හා කාසි වලට අමතරව එක් වී ඇති මුදල් නෝට්ටු හා කාසි ප්‍රමාණය දක්වෙන වාර්තාවක් ඊ ලඟට වැඩ කරන දින දවල් 12 ට පෙරාතුව මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

මේ වගට,

**ඩබ්ලිව්. තෙන්නකෝන්**
නියෝජ්‍ය අධිපති.

**එස්. ඞී. අමරසිංහ**
ප්‍රධාන ගණකාධිකාරී.
ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1949 අංක 58 දරන මුදල් නීති පනත (ඇ) (i)

1954 අංක 33 දරන පනතින් සංශෝධිත 1948 අංක 59 දරන මුදල් නීති පනතේ 10 (සී), 92, 93, 95, සහ 96 යන වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද නියෝගය යි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1961 ජූලි 21 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලැබ, 1950 අගෝස්තු 28 වැනි දින අංක 10, 143 දරන ගැසට් පත්‍රයෙන් පළ කරනු ලැබ විටින් විට සංශෝධිත (ඩී) නියෝගය තවදුරටත් මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(i) එම නියෝගයෙහි 1 වැනි ඡේදය, එම ඡේදයෙහි (1) වැනි අනුච්ඡේදය වශයෙන් නැවත අංක යෙදීමෙන්.

(ii) එසේ නැවත අංකිත (1) අනුච්ඡේදයෙහි "ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රුපියල් තැන්පතුවල ස්වරූපය ගත යුතු ය" යන වචන වෙනුවට "යුතුය" යන වචන ආදේශ කැරීමෙන්.

(iii) (1) වැනි අනුච්ඡේදයට එක්බිතිවම පහත දැක්වෙන අනුච්ඡේදය ඇතුළත් කිරීමෙන්.:–

"2. (අ) මෙම ඡේදයෙහි (1) වැනි අනුච්ඡේදය යටතේ වෙළෙඳ බැංකු විසින් පවත්වා ගෙන යා යුතු සංචිත, මහ බැංකුවේ රුපියල් තැන්පතු සවරූපයෙන් හෝ කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතු සවරූපයෙන් සහ කොටසක් එකී බැංකුව සිය වත්කම් වශයෙන් තබා ඇති ලංකාවේ මුදල් නෝට්ටු හා කාසි වලින් හෝ විය යුතුය.

(ආ) වෙළෙඳ බැංකුවක් අවශ්‍ය සංචිත ප්‍රමාණයෙන් කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතු ස්වරූපයෙන් සහ කොටසක් එවැනි බැංකුවක සිය වත්කම් වශයෙන් තබා ගෙන ඇති ලංකාවේ නෝට්ටු හා කාසිවලින් පවත්වා ගෙන යාමට තීරණය කළ කල්හි, මහ බැංකුවෙහි රුපියල් තැන්පතුවක ස්වරූපයෙන් පවත්වා ගෙන යන එවැනි තැන්පතුවක කොටස සහ එවැනි බැංකුවක් සිය වත්කම් වශයෙන් තබා ඇති ලංකාවේ නෝට්ටු හා කාසිවලින් පවත්වාගෙන යන කොටස විටින් විට මුදල් මණ්ඩලය විසින් තීරණය කළ යුතු අතර, එම තීරණය එම බැංකුවට ලිඛිත දැන්වීමකින් විධිමත් ලෙස දැනුම් දිය යුතු ය." සහ

(iv) නියෝගයෙහි උප ලේඛනයෙහි "මහ බැංකුවෙහි තැන්පත් කළ යුතු වූ සංචිත" යන වචන වෙනුවට "අවශ්‍ය සංචිත" යන වචන ආදේශ කැරීමෙන්.

## 1949 අංක 58 දරන මුදල් නීති පනත – (ඇ) (i)

1954 අංක 33 දරන පනතින් සංශෝධිත 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10 (සී), 92, 93, 94, 95, සහ 96 යන වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද නියෝගය යි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1961 ජූලි 21 වැනි දින,
කොළඹ දී ය

### නියෝගය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලැබ, 1961 පෙබරවාරි 1 වැනි දින අංක 12, 280 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් පළ කරන ලද (ජී) නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) 2 වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කැරීමෙන්:–
"2. විශෙෂ සංචිත ප්‍රමාණය. 1 වැනි ජෙදයෙහි සඳහන් වැඩි කිරීම් වලින් සියයට තිස් අටකට සමාන විය යුතුය."

(2) 2 වැනි ඡේදයට එක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය යෙදීමෙන්.:–
"2(අ) (1), 1 වැනි ජෙදය යටතේ වෙළෙඳ බැංකු විසින් පවත්වා ගෙන යා යුතු විශෙෂ සංචිත, මහ බැංකුවේ රුපියල් තැන්පතුවක ස්වරූපයෙන් හෝ කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතුවක ස්වරූපයෙන් සහ කොටසක් එකී වෙළෙඳ බැංකු සිය වත්කම්හි කොටසක් වශයෙන් තබා ඇති ලංකාවේ මුදල් නෝට්ටු හා කාසිවලින් හෝ විය යුතු ය.

(2) වෙළෙඳ බැංකුවක් අවශ්‍ය සංචිත ප්‍රමාණයෙන් කොටසක් මහ බැංකුවේ රුපියල් තැන්පතු ස්වරූපයෙන් සහ කොටසක් එවැනි බැංකුවක සිය වත්–කම් වශයෙන් තබා ගෙන ඇති ලංකාවේ නෝට්ටු හා කාසිවලින් පවත්වා ගෙන යාමට තීරණය කළ කල්හි, මහ බැංකුවෙහි රුපියල් තැන්පතුවක ස්වරූපයෙන් පවත්වා ගෙන යන එවැනි තැන්පතුවක කොටස සහ එවැනි බැංකුවක සිය වත්කම් වශයෙන් තබා ඇති ලංකාවේ නෝට්ටු හා කාසිවලින් පවත්වා ගෙන යන කොටස විටින් විට මුදල් මණ්ඩලය විසින් තීරණය කළ යුතු අතර, එම තීරණය එම බැංකුවට ලිඛිත දැන්වීමකින් විධිමත් ලෙස දැනුම් දිය යුතු ය."

(3) එකී තුන් වැනි ජෙදයෙහි "(බී) නියෝගය යටතේ මහ බැංකුවෙහි" යන වචන වෙනුවට "බී නියෝගය යටතේ" යන වචන ආදේශ කැරීමෙන්

චක්‍රලේඛ අංක 15.

1961 අගෝස්තු 1 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.

## සමූපකාර සමිතිවල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට ගෙන මහ බැංකුව ගෙවන පොළී ප්‍රමාණය.

මෙරට වැවෙන කෘෂි භාණ්ඩ මිලයට ගැනීම, විකිණීම, ගබඩා කිරීම නිසා උද්ගතවන සමූපකාර සමිතිවල (සමූපකාර සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි) භාවිතීය පොරොන්දු නෝට්ටු ඇප කොට වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ගනු ලබන ණය සඳහා පොළිය අද පටන් සියයට 3 ක් විය යුතුය.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව,

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ශ්‍රී ලංකා මහ බැංකුව.

චක්‍ර ලේඛ ලිපි අංක 16

1961 සැප්තැම්බර් 25 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.

## සංචිත අවශ්‍යතා — 'ඩී' සහ 'ජී' රෙගුලාසි

1961 ජූලි 24 වැනි දින හා අංක 14 දරන අපගේ චක්‍ර ලේඛ ලිපියේ 2 වැනි ඡේදය සම්බන්ධවයි.

අද සිට, අවශ්‍ය සංචිත වලින් 75% ට වැඩිනොවන ප්‍රමාණයක් මුදල් නෝට්ටු හා කාසි ස්වරූපයෙන් වෙළෙඳ බැංකු වලට තබා ගත හැකි වන අතර ඉතිරි ප්‍රමාණය තැන්පතු වශයෙන් මහ බැංකුවේ තැන්පත් කළ යුතු බව වෙළෙඳ බැංකුවලට මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙහි "මුදල් නෝට්ටු හා කාසි" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1961 මාර්තු 15 වැනි දින ගිණුම් පියවන විට බැංකුවක තුබූ මුදල් වලට වැඩිමනත්ව එම බැංකුව වෙත ඇති මුදල් නෝට්ටු හා කාසි ය.

මේ වගට,

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී.
ශ්‍රී ලංකා මහ බැංකුව

ඩබ්ලිව්. තෙන්නකෝන්
නියෝජ්‍ය අධිපති.

## (ix) එක්සත් ජනපදයේ ඩොලර් සඳහා මහ බැංකුවේ විනිමය ගාස්තු

| දිනය | චක්‍ර ලේඛන අංකය | | මිලයට ගැනීම් (ඩොලර් 100 කට) | විකිණීම් (ඩොලර් 100 කට) |
|---|---|---|---|---|
| 2·1·61 | 1/153 | එතැන් | රු. 475·00 | රු. 475·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 475·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 11·1·61 | 1/154 | එතැන් | රු. 474·50 | රු. 474·75 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 474·50 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 2·2·61 | 1/155 | එතැන් | රු. 475·00 | රු. 475·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 475·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 10·2·61 | 1/156 | එතැන් | රු. 475·25 | රු. 475·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 475·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 17·2·61 | 1/157 | එතැන් | රු. 475·75 | රු. 476·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 475·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 27·2·61 | 1/158 | එතැන් | රු. 476·25 | රු. 476·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 7·3·61 | 1/159 | එතැන් | රු. 476·75 | රු. 477·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 10·3·61 | 1/160 | එතැන් | රු. 476·00 | රු. 476·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 22·3·61 | 1/161 | එතැන් | රු. 476·25 | රු. 476·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 27·3·61 | 1/162 | එතැන් | රු. 476·50 | රු. 476·75 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·50 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 11·4·61 | 1/163 | එතැන් | රු. 476·00 | රු. 476·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 3·5·61 | 1/164 | එතැන් | රු. 476·50 | රු. 476·75 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·50 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 16·5·61 | 1/165 | එතැන් | රු. 476·75 | රු. 477·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 476·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 29·5·61 | 1/166 | එතැන් | රු. 477·25 | රු. 477·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 477·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 7·6·61 | 1/167 | එතැන් | රු. 477·50 | රු. 477·75 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 477·50 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 13·6·61 | 1/168 | එතැන් | රු. 477·75 | රු. 478·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු. 477·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |

| දිනය | චක්‍ර ලේඛ අංකය | | මිලයට ගැනීම (ඩොලර් 100 කට) | විකිණීම (ඩොලර් 100 කට) |
|---|---|---|---|---|
| 26·6·61 | 1/169 | එතැන් | රු.478·00 | රු.478·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.478·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 7·7·61 | 1/170 | එතැන් | රු.478·25 | රු.478·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.478·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 28·7 61 | 1·171 | එතැන් | රු.477·75 | රු.478·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.477·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 3·8·61 | 1/172 | එතැන් | රු.477·00 | රු.477·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.477·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 7·8·61 | 1/173 | එතැන් | රු.476·25 | රු.476·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.476·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 30·8·61 | 1·174 | එතැන් | රු.475·75 | රු.476·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.475·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 6·9·61 | 1/175 | එතැන් | රු.475·00 | රු..475·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.475··00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 19·9·61 | 1/176 | එතැන් | රු.474·50 | රු.474·75 |
| | | ඉදිරි තෙමස දක්වා | රු..474·50 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 2·10·61 | 1/177 | එතැන් | රු.474·25 | රු.474·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.474·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 11·10·61 | 1/178 | එතැන් | රු.474·00 | රු.474·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.474·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 25·10·61 | 1/179 | එතැන් | රු.473·85 | රු.474·10 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.473·85 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 9·11·61 | 1/180 | එතැන් | රු.474·00 | රු.474·25 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.474·00 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 20·11·61 | 1/181 | එතැන් | රු.473·85 | රු.474·10 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.473·85 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 4·12·61 | 1/182 | එතැන් | රු.474·75 | රු.475·00 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.474·75 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 8·12·61 | 1/183 | එතැන් | රු.474·50 | රු.474·75 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.474·50 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එකතුව |
| 22·12·61 | 1/184 | එතැන් | රු.475·25 | රු.475·50 |
| | | ඉදිරි තෙමස දක්වා | රු.475·25 | මසකට සත 25 ක අධි මිලක් එතැන් මිලට එත්තුව |